# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2026 ඔක්තෝබර් මස 02 වන දින

## II වන කොටස

## අතිරේකය

(2026.10.06 දින නිකුත් කරන ලදී)


**සංවිධානාත්මක අපරාධ වැළැක්වීමේ**

**ජාතික සීමා ඉක්ම වූ සංවිධානාත්මක අපරාධවලට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතිය බලාත්මක කිරීම සඳහා ද; ඵලදායී ජාතික සහ අන්තර්ජාතික සහයෝගීතාව මගින් බරපතළ අපරාධ වැළැක්වීම, විමර්ශනය කිරීම සහ නඩු පැවරීම සඳහා ද; සංවිධානාත්මක අපරාධ කණ්ඩායම්වලින් ඉදිරිපත් වන තර්ජනවලින් සමාජය ආරක්ෂා කිරීම සඳහා ද සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි**

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගේ නියමය පරිදි
පළ කරන ලදී


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

**මිල : රු. 288.00** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## පටුන

*වගන්තිය* *පිටු අංකය*


පූර්විකාව 1

1. ලුහුඬු නාමය 2
2. මේ පනතේ පරමාර්ථ 2
3. මේ පනත අදාළ වීම 2


## I වන කොටස

### වැරදි සහ දණ්ඩන


4. සංවිධානාත්මක අපරාධ කණ්ඩායමක සාමාජිකයකු වීම 4
5. බරපතළ අපරාධයක් සිදු කිරීමට තැත් කිරීම, සිදු කිරීමට අනුබල දීම, කුමන්ත්‍රණය කිරීම ආදිය 7
6. සාමාන්‍ය සාපරාධී අරමුණක් ඉෂ්ට කර ගැනීම උදෙසා ක්‍රියා කිරීම 7
7. රැකවසන් ආදිය කිරීම 9
8. විමර්ශනය කරන හෝ සහාය ආදිය ලබා දෙන තැනැත්තන් තර්ජනය කර බිය වැද්දීම හෝ ඔවුන්ට පීඩා කිරීම 10
9. සංවිධානාත්මක අපරාධ කණ්ඩායමක් සඳහා සාමාජිකයන් ලෙස බඳවා ගැනීම 10
10. සංවිධානාත්මක අපරාධ කණ්ඩායමකට සහභාගී වීම 11
11. සංවිධානාත්මක අපරාධ කණ්ඩායමකට පරිශ්‍රයන් භාවිත කිරීමට අවසර දීම 11
12. වංචාකාරී ක්‍රියාවලට අදාළ වැරදි 12
13. සිද්ධියක් පිළිබඳව අවබෝධයක් තිබිය හැකි තැනැත්තකු වන විට 14
14. මේ පනත යටතේ බරපතළ අපරාධයකට අදාළ කාරණා ප්‍රකාශයට පත් කිරීම 15
15. සංස්ථාපිත මණ්ඩලයක් විසින් සිදු කරනු ලැබූ බරපතළ අපරාධය 17
16. නෛතික තැනැත්තකු වෙනුවෙන් ක්‍රියා කරන ජ්‍යෙෂ්ඨ නිලධරයකු වෙනුවෙන් නෛතික තැනැත්තා වගකිව යුතු බව හා වෙනත් දේ 18


## II වන කොටස

### විමර්ශනය සහ නඩු පැවරීම


17. නැවැත්වීම හා සෝදිසි කිරීම ආදියට ඇති බලය 20
18. අත්අඩංගුවට ගැනීමෙන් ආදියේ දී කාර්යපටිපාටිය 21
19. අත්අඩංගුවට ගැනීම පිළිබඳ දැනුම් දීම 22
20. මහෙස්ත්‍රාත්වරයකු වෙත ඉදිරිපත් කිරීම 23
21. රඳවා තැබීමේ නියමය 24
22. රඳවා තබා ගැනීම දීර්ඝ කිරීම 26
23. සැකකරුවකු ඇප මත මුදා හැරිය හැකි බව 27
24. සීමා කිරීමේ ආඥා 28
25. රිමාන්ඩ් භාරයේ තැබීම අතරතුර රඳවා තැබීම 31
26. රිමාන්ඩ් භාරයේ සිටින හෝ රඳවා තබා ඇති සැකකරුට නීතිඥවරයකු වෙත ප්‍රවේශ විය හැකි බව 33

*වගන්තිය* *පිටු අංකය*

27. නඩු විභාගය අවසන් වන තෙක් රඳවා තැබීම 33
28. විශේෂ විමර්ශන ක්‍රමවේද සඳහා අධිකරණ අවසරය 34
29. ඒකාබද්ධ විමර්ශන 35
30. මහේස්ත්‍රාත් අධිකරණයක් ඉදිරියේ වන නීතිකෘත්‍යය 36
31. බරපතළ අපරාධයක් සංඥෙය වැරැද්දක් විය යුතු බව සහ මේ පනත යටතේ බරපතළ අපරාධයක් මහාධිකරණය විසින් විසඳිය යුතු බව 36
32. අපරාධ නඩු විධාන සංග්‍රහය පනත අදාළ කර ගැනීම 36
33. 2006 අංක 19 දරන විද්‍යුත් ගනුදෙනු පනත අදාළ කර ගැනීම 37
34. කාලාවරෝධය ඉවත් කිරීම 37
35. අර්ථ නිරූපණය 37

## III වන කොටස

### පොලිස් නිලධරයකුගේ බලතල

36. මේ පනත යටතේ පොලිස් නිලධරයකුගේ බලතල 37
37. මේ පනත යටතේ බරපතළ අපරාධයක් සිදු කිරීම වැළැක්වීම පොලිස් නිලධරයකුගේ කාර්යය විය යුතු බව 38
38. වාහනයක් හෝ යාත්‍රාවක් යනාදිය නැවැත්වීමට බලය පාවිච්චි කිරීම 38
39. යම් වාහනයක හෝ යාත්‍රාවක ආදියේ පාලනය යටතට පවරා ගැනීම 39
40. යාත්‍රාවක් යාත්‍රා කිරීම හෝ ගුවන්යානයක් ගුවන්ගත වීම ආදිය අත්හිටුවීම හෝ ප්‍රමාද කිරීම 39
41. අයිතමයන් රජයේ රස පරීක්ෂකවරයා වෙත හෝ වෙනත් විශේෂඥයකු වෙත කෙලින් ම ඉදිරිපත් කිරීම 40
42. විමර්ශන කටයුතු සඳහා කරුණු භාර දීම 40
43. බැංකු, මූල්‍ය ආයතන ආදියෙන් තොරතුරු ලබා ගැනීම 41
44. සේවා සපයන්නන්ගෙන් තොරතුරු ලබා ගැනීම 42
45. දත්ත හා තොරතුරු සම්බන්ධව ඇති අවහිර කිරීම් ඉවත් කිරීම 44

## IV වන කොටස

### ප්‍රකාශනවල ආවේශ්‍යතාවය

46. සාක්ෂි ආඥාපනතේ ඇතැම් විධිවිධාන අදාළ නොවිය යුතු බව 46
47. සැකකරුවකු විසින් අත්සන් කළ ප්‍රකාශයක් ආවේශ්‍ය කර ගත හැකි බව 46
48. මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කළ සහ හඳුනාගැනීමේ පෙරෙට්ටුවක දී කරන ලද ඇතැම් ප්‍රකාශ ආවේශ්‍ය කරගත හැකි බව 48
49. ඇතැම් ලේඛන ආවේශ්‍ය කරගත හැකි බව 49
50. සාක්ෂි ආඥාපනතේ 54 වන වගන්තිය අදාළ නොවන බව 49
51. 46 වන, 47 වන, 48 වන සහ 49 වන වගන්තිවල විධිවිධාන අදාළ නොවිය යුතු බව 50
52. බොරු සාක්ෂි ලබා දීම 51
53. මහේස්ත්‍රාත්වරයකු වෙත කරනු ලැබූ ප්‍රකාශයක ආවේශ්‍යතාවය සඳහා සපුරාලිය යුතු පූර්ව කොන්දේසි 51

## V වන කොටස

### හෙළිදරව් කිරීම සහ රහසින් දැනුම්දීම


54. දැනුම්දෙන්නකුගේ තොරතුරු සහ අනන්‍යතාවය හෙළිදරව් නොකිරීම 52
55. දැනුම්දෙන්නකු විසින් තොරතුරු හෙළිදරව් කිරීම 53
56. රහසින් දැනුම් දීම 54


## VI වන කොටස

### සාමාන්‍ය විධිවිධාන


57. සන්තක කිරීම 55
58. දණ්ඩන නියම කිරීමට අදාළ විශේෂ විධිවිධාන 57
59. නඩු කටයුතුවල දී ආරක්ෂාව 57
60. ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උද්ර්පන පනත සංශෝධනය කිරීම 57
61. මේ පනතේ බරපතළ අපරාධ සඳහා විධිවිධාන සැලසීම සලකා බැලීමට රාජ්‍යයන් සමග බලාත්මකව පවතින උද්ර්පන වැඩපිළිවෙළවල් 58
62. සම්මුතිය මේ පනතේ බරපතළ අපරාධ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව සහ ඇතැම් රාජ්‍යයන් අතර ඇති කර ගන්නා උද්ර්පන වැඩපිළිවෙළක් ලෙස අමාත්‍යවරයා විසින් සැලකිය හැකි බව 58
63. උද්ර්පන ඉල්ලීමක් කරනු ලැබුවේ යම් රාජ්‍යයක තැනැත්තන් සම්බන්ධයෙන් ද එවැනි තැනැත්තන්ට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ග ඉල්ලුම්කාර රාජ්‍යයට දැනුම් දීම අමාත්‍යවරයාගේ කාර්යය විය යුතු බව 58
64. රාජ්‍යයකට සහාය දැක්වීම 59
65. තොරතුරු ලබා දීමට ඇති නීතිමය බැඳීම 59
66. අර්ථ නිරූපණය 60
67. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව 63

එල්.ඩී. - ඕ 10/2026

**ජාතික සීමා ඉක්ම වූ සංවිධානාත්මක අපරාධවලට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතිය බලාත්මක කිරීම සඳහා ද; ඵලදායී ජාතික සහ අන්තර්ජාතික සහයෝගීතාව මගින් බරපතළ අපරාධ වැළැක්වීම, විමර්ශනය කිරීම සහ නඩු පැවරීම සඳහා ද; සංවිධානාත්මක අපරාධ කණ්ඩායම්වලින් ඉදිරිපත් වන තර්ජනවලින් සමාජය ආරක්ෂා කිරීම සඳහා ද සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

පූර්විකාව

(මෙහි මින් මතු "සම්මුතිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික සීමා ඉක්ම වූ සංවිධානාත්මක අපරාධවලට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතිය 2000 නොවැම්බර් මස 15 වන දින නිව්යෝර්ක්හි දී එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද හෙයින් ද:

ශ්‍රී ලංකාව විසින් 2006 සැප්තැම්බර් මස 22 වෙනි දින දී එකී සම්මුතිය අපරානුමත කරනු ලැබ ඇති හෙයින් ද:

බරපතළ අපරාධවල පරිමාණය, සංකීර්ණ බව සහ අහිතකර බලපෑම ක්‍රමයෙන් වැඩි වී පොදු සුරක්ෂිතභාවයට, ජාතික ආරක්ෂාවට, ආර්ථිකයට සහ නීතියේ ආධිපත්‍යයට බරපතළ තර්ජන ඉදිරිපත් කර ඇති හෙයින්ද; බරපතළ අපරාධ වැළැක්වීම, විමර්ශනය කිරීම, වරදකරුවන්ට නඩු පැවරීම සහ දඬුවම් කිරීම සඳහා නීතිමය රාමුව ශක්තිමත් කිරීම අවශ්‍ය වී ඇති හෙයින් ද:

ඉහත කී සම්මුතිය යටතේ ශ්‍රී ලංකාවේ වගකීම්වලට බලාත්මකභාවයක් ලබා දීමට සහ ශ්‍රී ලංකාවේ බරපතළ අපරාධ වැළැක්වීම සහ බරපතළ අපරාධවලට විරුද්ධව කටයුතු කිරීම සඳහා ව්‍යවස්ථාදායක විධිවිධාන සැලැස්වීමට ශ්‍රී ලංකා රජයට අවශ්‍ය වී ඇති හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

PL 15938 - 465 (2026/09)

ලුහුඬු නාමය

**1.** මේ පනත 2026 අංක  දරන සංවිධානාත්මක අපරාධ වැළැක්වීමේ පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

මේ පනතේ පරමාර්ථ

**2.** මේ පනතේ පරමාර්ථ -

(අ) සංවිධානාත්මක අපරාධ කණ්ඩායම්වල සහ එවැනි සංවිධානාත්මක අපරාධ කණ්ඩායම්වලට සම්බන්ධ තැනැත්තන්ගේ ක්‍රියාකාරකම් වැළැක්වීම, මර්දනය කිරීම සහ අවහිර කිරීම;

(ආ) බරපතළ අපරාධ පිළිබඳ විමර්ශන කටයුතු පැවැත්වීමට සහ වරදකරුවන්ට නඩු පැවරීමට පහසුකම් සැලැස්වීම;

(ඇ) මෙම පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම පිණිස ජාතික සහ අන්තර්ජාතික සහයෝගීතාවය ප්‍රවර්ධනය කිරීම සහ ඒ සඳහා පහසුකම් සැලැස්වීම; සහ

(ඈ) එවැනි සංවිධානාත්මක අපරාධ කණ්ඩායම් මගින් සිදු වන හෝ සිදු විය හැකි පීඩාවලින් ජනතාව ආරක්ෂා කිරීම,

විය යුතු ය.

මේ පනත අදාළ වීම

**3.** (මේ පනතෙහි “බරපතළ අපරාධයක්” යනුවෙන් හඳුන්වනු ලබන) මේ පනතේ හෝ මෙහි පළමු උපලේඛනයේ හෝ නිශ්චිතව දක්වා ඇති හෝ දෙයාකාරයෙන් එක් ආකාරයකට වසර හතරක් හෝ ඊට වැඩි කාලසීමාවක් වන උපරිම කාලසීමාවක් සඳහා වන බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් පමුණුවනු ලබන යම් වරදක් සිදු කිරීමේ දී -

(අ) ශ්‍රී ලංකා ජනරජයට අයත් දේශය තුළ හෝ ඉන් පිටත සිටින යම් ශ්‍රී ලාංකික පුරවැසියකු; හෝ

(ආ) පහත අවස්ථාවල දී-

(i) සම්පූර්ණයෙන් ම හෝ කොටසක් වශයෙන් ශ්‍රී ලංකාව තුළ දී;

(ii) ශ්‍රී ලංකාවේ අයත් දේශීය ජල තීරය තුළ හෝ ඊට ඉහළින්;

(iii) ශ්‍රී ලංකා ජනරජයට අයත් දේශයේ ගුවන් සීමාව තුළ දී;

(iv) ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි කරන ලද හෝ ශ්‍රී ලංකාව තුළ සිටින යම් තැනැත්තකු විසින් බදු ගන්නා ලද ගුවන් යානයක් හෝ යාත්‍රාවක් තුළ දී හෝ ඒ සම්බන්ධයෙන්;

(v) ශ්‍රී ලංකා ජනරජයට අයත් දේශයේ දේශීය ජල තීරය සහ ගුවන් සීමාව ද ඇතුළුව එම ජනරජයට අයත් දේශය තුළ වන යාත්‍රාවක් හෝ ගුවන් යානයක් තුළ දී හෝ ඒ සම්බන්ධයෙන්;

(vi) සම්පූර්ණයෙන් ම හෝ කොටසක් වශයෙන් ශ්‍රී ලංකාවේ රාජ්‍ය දූත මණ්ඩලයක හෝ කොන්සල් දූත මණ්ඩලයක පරිශ්‍රයක් තුළ දී හෝ එවැනි පරිශ්‍රයක් සම්බන්ධයෙන් හෝ ශ්‍රී ලංකාවේ රාජ්‍ය දූත මණ්ඩලයක හෝ කොන්සල් දූත මණ්ඩලයක කාර්යාලයක් තුළ දී හෝ ශ්‍රී ලංකාවේ එවැනි රාජ්‍ය දූත මණ්ඩලයක හෝ කොන්සල් දූත මණ්ඩලයක ප්‍රධානියාගේ පදිංචි ස්ථානය තුළ දී හෝ යම් රාජ්‍ය දූත මණ්ඩලයක හෝ කොන්සල් දූත මණ්ඩලයක නිලධරයකුගේ හෝ එහි වෙනත් සේවානියුක්තයකුගේ පදිංචි ස්ථානය තුළ දී; හෝ

(vii) සම්පූර්ණයෙන් ම හෝ කොටසක් වශයෙන් ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත

මණ්ඩලයකට අයත් ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටා ඇති කාර්යාල පරිශ්‍රයක් තුළ දී හෝ එවැනි පරිශ්‍රයක් සම්බන්ධයෙන් හෝ එවැනි ව්‍යවස්ථාපිත මණ්ඩලයක යම් සේවා නියුක්තකයකුගේ පදිංචි ස්ථානය තුළ දී,

යම් තැනැත්තකු,

එවැනි බරපතළ අපරාධයක් සංවිධානාත්මක අපරාධ කණ්ඩායමක සාමාජිකයකු ලෙස සිදු කරන අවස්ථාවක මේ පනත යටතේ එවැනි වැරදි වැළැක්වීමට, විමර්ශනය කිරීමට, වැරදිකරුවන්ට නඩු පැවරීමට සහ දඬුවම් කිරීමට අදාළව මේ පනතේ විධිවිධාන අදාළ කර ගත යුතු ය.

## I වන කොටස

### වැරදි සහ දණ්ඩන

සංවිධානාත්මක අපරාධ කණ්ඩායමක සාමාජිකයකු වීම

**4.** (1) සංවිධානාත්මක අපරාධ කණ්ඩායමක සාමාජිකයකු වන හෝ සාමාජිකයකු ලෙස ක්‍රියා කරන සහ මූල්‍යමය හෝ වෙනත් ද්‍රව්‍යමය ප්‍රතිලාභයක් කෙලින් ම හෝ අනියම් ආකාරයෙන් ලබා ගැනීම සඳහා වෙනත් තැනැත්තකු හෝ තැනැත්තන් සමග එකඟ වී බරපතළ අපරාධයක් සිදු කරන යම් තැනැත්තකු මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබීමේ දී වසර පහකට නොඅඩු සහ වසර විස්සකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට සහ රුපියල් මිලියනයකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකු සංවිධානාත්මක අපරාධ කණ්ඩායමක සාමාජිකයකු වන බව හෝ සංවිධානාත්මක අපරාධ කණ්ඩායමක සාමාජිකයකු ලෙස ක්‍රියාකරන බව පිළිබඳව තීරණය කිරීමේ දී පහත කාරණා සඳහා

සීමා නොවන අධිකරණයක් විසින් සලකා බැලීමට ඇතුළත් කළ හැකි කාරණා පහත පරිදි වේ:-

(අ) සංවිධානාත්මක අපරාධ කණ්ඩායමේ ප්‍රකට සාමාජිකයන් හා ඒ තැනැත්තාගේ භෞතිකව හෝ අතථ්‍ය රැස්වීම් මගින් වන සම්බන්ධතාවයක් තිබේ ද යන්න;

(ආ) සංවිධානාත්මක අපරාධ කණ්ඩායමේ (වර්තමානයේ සිටින හෝ කලින් සිටි සාමාජිකයන්) ප්‍රකට සාමාජිකයන් විසින් ඒ තැනැත්තා සාමාජිකයකු ලෙස හඳුනාගෙන තිබේ ද යන්න;

(ඇ) සංවිධානාත්මක අපරාධ කණ්ඩායමේ ප්‍රකට සාමාජිකයන් භාවිත කරන ඇඳුම් විලාසිතා, හස්ත මුද්‍රා, භාෂාව හෝ පච්ච සටහන් ඒ තැනැත්තා විසින් භාවිත කරන්නේ ද යන්න;

(ඈ) ඒ තැනැත්තා සංවිධානාත්මක අපරාධ කණ්ඩායමේ ප්‍රකට සාමාජිකයන් සමග සම්බන්ධ වී සිටින්නේ ද යන්න;

(ඉ) ඒ තැනැත්තා විසින් සංවිධානාත්මක අපරාධ කණ්ඩායමේ සාමාජිකයකු ලෙස වෙනත් යම් තැනැත්තකු බඳවාගෙන තිබේ ද නැතහොත් බඳවා ගැනීමට උත්සාහ කර තිබේ ද යන්න;

(ඊ) සංවිධානාත්මක අපරාධ කණ්ඩායම විසින් භාවිත කරනු ලබන බවට ප්‍රකට පරිශ්‍රවලට හෝ මුණගැසෙන ස්ථානවලට ඒ තැනැත්තා පුරුද්දක් වශයෙන් පැමිණෙන්නේ ද යන්න සහ එවැනි පරිශ්‍රයන් හෝ මුණගැසෙන ස්ථාන සංවිධානාත්මක අපරාධ කණ්ඩායමට අයිති ස්ථාන හෝ සංවිධානාත්මක අපරාධ කණ්ඩායම පදිංචි ස්ථාන බවට ඒ තැනැත්තා දැනුවත්ව සිටින්නේ ද නැතහොත් ඒ පිළිබඳව

විශ්වාස කිරීමට ඒ තැනැත්තා සතුව සාධාරණ හේතු පවතින්නේ ද යන්න;

(උ) සංවිධානාත්මක අපරාධ කණ්ඩායමේ සුපුරුදු අපරාධ කටයුත්තකට අනුරූප වන්නා වූ යම් බරපතළ අපරාධයක් වෙනුවෙන් සංවිධානාත්මක අපරාධ කණ්ඩායමක ප්‍රකට සාමාජිකයන් සමඟ ඒ තැනැත්තා එක වතාවකට වඩා වැඩි වාර ගණනක් අත්අඩංගුවට පත් වී තිබෙන්නේ ද යන්න;

(ඌ) ඒ තැනැත්තා යම් සාක්ෂි අනුව සංවිධානාත්මක අපරාධ කණ්ඩායමක සාමාජිකයකු ලෙසට හඳුනාගෙන තිබෙන්නේ ද යන්න;

(එ) ඒ තැනැත්තා සංවිධානාත්මක අපරාධ කණ්ඩායමේ යම් මූල්‍යමය ප්‍රතිලාභයක් හෝ වෙනත් ද්‍රව්‍යමය ප්‍රතිලාභයක් ලබාගෙන තිබේ ද නැතහොත් ලබා ගනිමින් සිටී ද යන්න;

(ඒ) ඒ තැනැත්තා සංවිධානාත්මක අපරාධ කණ්ඩායමේ සාමාජිකයන් එකෙකු හෝ ඊට වැඩි ගණනක් සමග එක්ව මීට පෙර අවස්ථාවක බරපතළ අපරාධ එකක් හෝ ඊට වැඩි ගණනක් සිදු කර තිබෙන්නේ ද යන්න;

(ඔ) සංවිධානාත්මක අපරාධ කණ්ඩායමේ සාමාජිකයකු වීමට ඒ තැනැත්තා ලියාපදිංචි වී තිබේ ද යන්න; හෝ

(ඕ) සංවිධානාත්මක අපරාධ කණ්ඩායමේ ක්‍රියාවන්ට අදාළ යම් ප්‍රාරම්භන අවස්ථාවකට, අධ්‍යාපනික හෝ ක්‍රියාත්මක වීමේ සැසිවලට ඒ තැනැත්තා සහභාගි වී තිබේ ද යන්න හෝ සංවිධානාත්මක අපරාධ කණ්ඩායමේ යම් විනය පාලන පද්ධතියකට යටත්ව සිටින්නේ ද යන්න.

බරපතළ අපරාධයක් සිදු කිරීමට තැත් කිරීම, සිදු කිරීමට අනුබල දීම හෝ කුමන්ත්‍රණය කිරීම ආදිය

**5.** (1) යම් තැනැත්තකු, බරපතළ අපරාධයක් සිදු කිරීමට තැත් කරනු ලබන්නේ නම්, අනුබල දෙනු ලබන්නේ නම්, කුමන්ත්‍රණය කරනු ලබන්නේ නම්, සංවිධානය කරනු ලබන්නේ නම්, පහසුකම් සලසන්නේ නම්, උපදෙස් දෙන්නේ නම්, කූට්ටනය කරන්නේ නම්, විධානය කරන්නේ නම්, ආධාර දෙන්නේ නම්, දිරි දෙන්නේ නම්, පොළඹවන්නේ නම්, උනන්දු කරවන්නේ නම්, අණකරන්නේ නම්, උපදේශනය කරන්නේ නම් හෝ සූදානම් වන්නේ නම් හෝ බරපතළ අපරාධයක් සිදු කිරීමට සූදානමින් යම් ක්‍රියාවක් කරනු ලබන හෝ එම තැත් කිරීමේ, අනුබල දීමේ, කුමන්ත්‍රණය කිරීමේ, සංවිධානය කිරීමේ, පහසුකම් සැලසීමේ, උපදෙස් දීමේ, කූට්ටනය කිරීමේ, විධානය කිරීමේ, ආධාර දීමේ, දිරි දීමේ, පොළඹවීමේ, උනන්දු කරවීමේ, අණ කිරීමේ, උපදේශනය කිරීමේ හෝ සූදානම් වීමේ ප්‍රතිඵලයක් ලෙස බරපතළ අපරාධයක් සිදු කරනු ලබන හෝ යම් තැනැත්තකු 6 වන වගන්තිය යටතේ වන වරද සඳහා පනවන ලද දණ්ඩනයට ම යටත් විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් යම් තැත් කිරීමේ, අනුබල දීමේ, කුමන්ත්‍රණය කිරීමේ, සංවිධානය කිරීමේ, පහසුකම් සැලසීමේ, උපදෙස් දීමේ, කූට්ටනය කිරීමේ, විධානය කිරීමේ, ආධාර දීමේ, දිරි දීමේ, පොළඹවීමේ, උනන්දු කරවීමේ, අණ කිරීමේ, උපදේශනය කිරීමේ හෝ සූදානම් වීමේ ප්‍රතිඵලයක් ලෙස 6 වන වගන්තිය යටතේ වන වරදක් සිදු කරනු නොලැබූ විට එම තැනැත්තා මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබීමේ දී අවුරුදු දෙකකට නොඅඩු සහ අවුරුදු පහළොවකට නොවැඩි දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට සහ රුපියල් ලක්ෂ පහකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.

සාමාන්‍ය සාපරාධී අරමුණක් ඉෂ්ට කර ගැනීම උදෙසා ක්‍රියා කිරීම

**6.** (1) සංවිධානාත්මක අපරාධ කණ්ඩායමක් විසින් දරනු ලබන සාමාන්‍ය සාපරාධී අරමුණක් ඉෂ්ට කර ගැනීම උදෙසා -

(අ) බරපතළ අපරාධයක් සිදු කරන; හෝ

(ආ) දැන දැන ම වෙනත් යම් ක්‍රියාවක් සිදු කරන,

යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබයි.

(2) සංවිධානාත්මක අපරාධ කණ්ඩායමක සාමාජිකයකු වන්නා වූ යම් තැනැත්තකු-

(අ) (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ වූ බරපතළ අපරාධයකට වරදකරු කරනු ලැබීමේ දී වෙනත් යම් නීතියක් යටතේ එවැනි වරදක් සම්බන්ධයෙන් පනවනු ලබන උපරිම බන්ධනාගාරගත කිරීමක දෙගුණයකට අඩු නොවූ දඬුවමක් වූ ද, එහෙත් අවුරුදු පහළොවක කාල සීමාවක් නොඉක්මවන්නා වූ දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හා දඩයකට යටත් විය යුතු අතර, නියම කරන ලද දඬුවම ජීවිතාන්තය දක්වා බන්ධනාගාරගත කිරීම හෝ මරණීය දණ්ඩනය වන අවස්ථාවක ඒ වෙනත් නීතියෙන් ඒ සඳහා විධිවිධාන සලසා ඇති පරිදි වූ දඬුවමකට යටත් විය යුතු ය; සහ

(ආ) (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ වූ වරදකට වරදකරු කරනු ලැබීමේ දී, වසර දෙකකට නොඅඩු සහ වසර පහළොවකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට සහ රුපියල් ලක්ෂ පහක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

(3) සංවිධානාත්මක අපරාධ කණ්ඩායමක සාමාජිකයකු නොවන-

(අ) (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ වූ බරපතළ අපරාධයකට වරදකරු කරනු ලබන තැනැත්තකු වෙනත් යම් නීතියක් යටතේ ඒ වරද සඳහා විධිවිධාන සලසා ඇති බන්ධනාගාරගත කිරීමේ කාල සීමාව මෙන් හරි අඩකින් වැඩි කරන ලද කාල සීමාවක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හා දඩයකට යටත් විය යුතු නමුත් එය අවුරුදු තුනකට නොඅඩු විය

යුතු සහ අවුරුදු පහළොවක් නොඉක්ම විය යුතු ය. තව ද නියම කරන ලද දඬුවම ජීවිතාන්තය දක්වා වූ බන්ධනාගාරගත කිරීමක් හෝ මරණීය දණ්ඩනය වන අවස්ථාවක, ඒ වෙනත් යම් නීතියේ විධිවිධාන සලස්වා ඇති පරිදි දඬුවම් කරනු ලැබිය යුතු ය; සහ

(ආ) (1) වන උපවගන්තිය (ආ) ඡේදය යටතේ වූ වරදකට වරදකරු කරනු ලබන තැනැත්තකු අවුරුදු දෙකකට නොඅඩු සහ අවුරුදු දහයක් නොඉක්මවන කාල සීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට සහ රුපියල් ලක්ෂ තුනක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

රැකවරණ කිරීම ආදිය

**7.** වෙනත් තැනැත්තකු විසින්, මේ පනත යටතේ වරදක් සිදු කරනු ලැබ ඇති බවට හෝ වරදක් සිදු කරමින් සිටින බවට හෝ දැන සිටින හෝ විශ්වාස කිරීමට හේතු ඇති යම් තැනැත්තකු විසින් ඒ වෙනත් තැනැත්තාට නීත්‍යානුකූල දඬුවම් ලබා දීම වැළැක්වීමේ අරමුණින් ඒ වෙනත් තැනැත්තා රැකවරණ කරන, ඔහු සඟවා තබන, සහාය දෙන හෝ නඩත්තු කරන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන අතර, මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබීමේ දී,-

(අ) ඔහු සංවිධානාත්මක අපරාධ කණ්ඩායමක සාමාජිකයකු වන්නේ නම්, වසර පහකට නොඅඩු සහ වසර දහයකට නොවැඩි කාලසීමාවක් සඳහා බන්ධනාගාරගත කිරීමකට සහ රුපියල් ලක්ෂ තුනක් නොඉක්මවන දඩයකට; හෝ

(ආ) ඔහු සංවිධානාත්මක අපරාධ කණ්ඩායමක සාමාජිකයකු නොවන්නේ නම්, වසර දෙකකට නොඅඩු සහ වසර පහකට නොවැඩි කාලසීමාවක් සඳහා බන්ධනාගාරගත කිරීමකට සහ රුපියල් ලක්ෂයක් නොඉක්මවන දඩයකට,

යටත් විය යුතු ය.

විමර්ශනය කරන හෝ සහාය ආදිය ලබා දෙන තැනැත්තන් තර්ජනය කර බිය වැද්දීම හෝ ඔවුන්ට පීඩා කිරීම

8. (1) මේ පනත යටතේ බරපතළ අපරාධයක් සිදු කිරීම සම්බන්ධයෙන් වන -

(අ) අසත්‍යය දිවුරා කරනු ලබන ප්‍රකාශයක් ලබා දීමට කැමති කරවා ගැනීමට; හෝ

(ආ) දිවුරා කරනු ලබන ප්‍රකාශයක් ලබාදීමේ දී හෝ සාක්ෂි ඉදිරිපත් කිරීමේ දී බාධා කිරීමට,

බලය යොදවන, තර්ජනය කරන හෝ තර්ජනය කර බිය වද්දන හෝ යම් අයෝග්‍ය වාසියක් පොරොන්දු වන, පිරිනමන හෝ ලබා දෙන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන අතර, මහාධිකරණය මගින් වරදට වරදකරු කරනු ලැබීමේ දී වසර පහකට නොඅඩු සහ වසර පහළොවකට නොවැඩි දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට සහ රුපියල් ලක්ෂ පහක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

(2) මේ පනත යටතේ වන බරපතළ අපරාධයක් සිදු කිරීමට අදාළව, නීතිය බලාත්මක කිරීමේ ආයතනවල, පැමිණිල්ල මෙහෙයවන ආයතනවල හෝ අධිකරණ නිලධරයන්ගේ කාර්යයන්ට මැදිහත්වීම සඳහා බලය පාවිච්චි කරන, තර්ජනය කරන හෝ තර්ජනය කර බිය වද්දන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදුකරනු ලබන අතර, මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබීමේ දී, වසර පහකට නොඅඩුවූ ද වසර පහළොවකට නොවැඩිවූ ද කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට සහ රුපියල් ලක්ෂ පහකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.

සංවිධානාත්මක අපරාධ කණ්ඩායමක් සඳහා සාමාජිකයන් ලෙස බඳවා ගැනීම

**9.** තැනැත්තකු විසින් යම් කණ්ඩායමක් සංවිධානාත්මක අපරාධ කණ්ඩායමක් බවට දැනුම්වත්ව හෝ එසේ විශ්වාස කිරීමට හේතු ඇතිව ඒ කණ්ඩායමට සාමාජිකයකු වශයෙන් බැඳෙන ලෙසට හෝ ඒ කණ්ඩායමේ පාලනයට සහාය දක්වන ලෙසට-

(අ) වෙනත් තැනැත්තකුට දිරිදෙන, වෙනත් තැනැත්තකු කැමති කරවාගන්නා හෝ කැඳවන; හෝ

(ආ) වෙනත් යම් තැනැත්තකුට දිරිදීම පිණිස, වෙනත් තැනැත්තකු කැමති කරවාගැනීම හෝ කැඳවීම පිණිස ඒ තැනැත්තාට යම් සාහසික ක්‍රියාවක්, තර්ජනය කිරීමක් හෝ තර්ජනය කිරීමෙන් පොළඹවා ගැනීමට තැත් කිරීමක් කරන,

තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබීමේ දී වසර පහළොවකට නොවැඩි දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට සහ රුපියල් ලක්ෂ පහක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

සංවිධානාත්මක අපරාධ කණ්ඩායමකට සහභාගි වීම

**10.** යම් තැනැත්තකු විසින් -

(අ) සංවිධානාත්මක අපරාධ කණ්ඩායමේ ඉලක්කය හෝ සාමාන්‍ය ක්‍රියාව පිළිබඳ දැනුම්වත්ව හෝ සංවිධානාත්මක අපරාධ කණ්ඩායමේ අරමුණ මේ පනත යටතේ වන බරපතළ අපරාධයක් සිදු කිරීම යන්න පිළිබඳ දැනුම්වත්ව; හෝ

(ආ) සංවිධානාත්මක අපරාධ කණ්ඩායමේ ඉලක්කය සපුරා ගැනීමට ඒ තැනැත්තාගේ හැසිරීම ඉවහල් වන බව හෝ එහි අභිප්‍රාය මේ පනත යටතේ වන වරදක් සිදු කිරීම යන්න පිළිබඳ දැනුම්වත්ව,

සංවිධානාත්මක අපරාධ කණ්ඩායමක යම් ඕනෑම ක්‍රියාවක දී හිතාමතා ම හෝ දැනුම්වත්ව ම සක්‍රියව සහභාගි වීම වරදක් වන අතර, ඒ තැනැත්තා මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබීමේ දී වසර පහළොවකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට සහ රුපියල් ලක්ෂ පහක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

සංවිධානාත්මක අපරාධ කණ්ඩායමකට පරිශ්‍රයන් භාවිත කිරීමට අවසර දීම

**11.** යම් තැනැත්තකු විසින් -

(අ) මේ පනත යටතේ වන බරපතළ අපරාධයක්; හෝ

(ආ) සංවිධානාත්මක අපරාධ කණ්ඩායමක් වෙත මූල්‍ය හෝ වෙනත් ද්‍රව්‍යමය ප්‍රතිලාභයක් ප්‍රදානය කිරීමේ

කාර්යය සඳහා වන, වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ වන වරදක්,

සිදු කිරීමට සහාය වීම, ආධාර කිරීම හෝ අනුබල දීම පිණිස, ඒ තැනැත්තාට අයිති හෝ පදිංචි නැතහොත් ඒ තැනැත්තාගේ පාලනය යටතේ පවතින යම් පරිශ්‍රයක් භාවිත කිරීමට සංවිධානාත්මක අපරාධ කණ්ඩායමක් බවට ඒ තැනැත්තා දැනුම්වත් හෝ විශ්වාස කිරීමට සාධාරණ හේතු ඇති යම් සංවිධානාත්මක අපරාධ කණ්ඩායමට හෝ සංවිධානාත්මක අපරාධ කණ්ඩායමක යම් සාමාජිකයකුට අවසර ලබා දීම වරදක් වන අතර, මහාධිකරණය විසින් වරදට වරදකරු කරනු ලැබීමේ දී වසර දහයකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් ලක්ෂ තුනක් නොඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දෙකට ම හෝ යටත් විය යුතු ය.

වංචාකාරී ක්‍රියාවලට අදාළ වැරදි

**12.** (1) (අ) (i) වංචාකාරී ක්‍රියා රටාවක් මාර්ගයෙන් කෙලින් ම හෝ වක්‍රාකාරයෙන් උත්පාදනය වන යම් දේපළක් ලබා ගැනීම හෝ රඳවා ගැනීම;

(ii) ඒ දේපළ එසේ උත්පාදනය වූ බවට දැන සිටීම හෝ සාධාරණව දැන සිටිය හැකිව තිබීම; සහ

(iii) යම් ව්‍යාපාරයක අයිතියක් අත්කර ගැනීමේ දී හෝ යම් ව්‍යාපාරයක් පිහිටුවීමේ දී, ක්‍රියාත්මක කිරීමක දී හෝ එහි කටයුතුවල දී එවැනි දේපළක යම් කොටසක් කෙලින් ම හෝ වක්‍රාකාරයෙන් භාවිත කිරීම හෝ ආයෝජනය කිරීම;

(ආ) (i) යම් ව්‍යාපාරයක් වෙනුවෙන් කෙලින් ම හෝ වක්‍රාකාරයෙන් යම් දේපළක් ලබා ගැනීම හෝ රඳවා ගැනීම; සහ

(ii) ඒ දේපළ වංචනික ක්‍රියා රටාවක් මගින් හෝ ඒ හරහා ව්‍යුත්පන්න වූ හෝ ව්‍යුත්පන්න වන බවට දැන සිටීම හෝ සාධාරණව දැන සිටිනු ලැබ තිබීම;

(ඈ) (i) යම් ව්‍යාපාරයක් වෙනුවෙන් හෝ යම් ව්‍යාපාරයක යම් අයිතියක් අත්කර ගැනීමේ දී හෝ යම් ව්‍යාපාරයක් පිහිටුවීමේ දී, ක්‍රියාත්මක කිරීමක දී හෝ එහි කටයුතුවල දී යම් දේපළක් කෙලින් ම හෝ වක්‍රාකාරයෙන් භාවිත කිරීම හෝ ආයෝජනය කිරීම; සහ

(ii) එම දේපළ වංචනික ක්‍රියා රටාවක් මගින් හෝ ඒ හරහා ව්‍යුත්පන්න වූ බව හෝ ව්‍යුත්පන්න වන බව හෝ දැන සිටීම හෝ සාධාරණව දැන සිටිනු ලැබ තිබීම;

(ඇ) වංචනික ක්‍රියා රටාවක් මාර්ගයෙන් යම් ව්‍යාපාරයක් යම් අයිතියක් හෝ පාලනයක් කෙලින් ම හෝ වක්‍රාකාරයෙන් අත්කර ගැනීම හෝ පවත්වාගෙන යාම;

(ඉ) යම් ව්‍යාපාරයක් කළමනාකරණය කරන අතරතුර දී හෝ එයට සම්බන්ධිතව සිටිය දී හෝ එහි සේවයෙහි යොදවා ඇති අතරතුර දී වංචනික ක්‍රියා රටාවක් මාර්ගයෙන් කෙලින් ම හෝ වක්‍රාකාරයෙන් ව්‍යාපාරයේ කටයුතු පවත්වාගෙන යාමට හෝ පවත්වාගෙන යාමේ දී සහභාගී වීම; හෝ

(ඊ) ව්‍යාපාරයක ක්‍රියාකාරීත්වය හෝ කටයුතු කළමනාකරණය කරන තැනැත්තකු ඒ ව්‍යාපාරයෙහි සේවයේ යොදවා ඇති හෝ එයට සම්බන්ධ වී ක්‍රියා කරන අතරතුර දී යම් තැනැත්තකු විසින් කෙලින් ම හෝ වක්‍රාකාරයෙන් වංචනික ක්‍රියා රටාවක් මගින්

ඒ ව්‍යාපාරයේ කටයුතු පවත්වාගෙන යන බවට හෝ පවත්වාගෙන යාමට සම්බන්ධ වන බවට දැන සිටීම හෝ සාධාරණව දැන සිටිනු ලැබිය හැකි වීම,

යම් තැනැත්තකු විසින් සිදු කරනු ලබයි නම්, ඒ තැනැත්තා විසින් වරදක් සිදු කරනු ලබන අතර, මහාධිකරණ විසින් ඔහු වරදකරු කරනු ලැබීමේ දී වසර පහළොවකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් ලක්ෂ පහකට නොවැඩි දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දෙකට ම හෝ යටත් විය යුතු ය.

(2) මේ වගන්තියේ කාර්ය සඳහා “වංචාකාරී ක්‍රියා රටාව” යන්නෙන්, මේ පනත යටතේ වන යම් බරපතළ වරදකට සැලසුම් සහගත ලෙස, දිගටම, අඛණ්ඩව හෝ නැවත නැවතත් සහභාගීවීම හෝ සම්බන්ධවීම අදහස් වන අතර, ඊට, යටත් පිරිසෙයින්, එවැනි බරපතළ අපරාධ දෙකක්වත් ඇතුළත් වේ. ඉන් එක් බරපතළ අපරාධයක් මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවීමෙන් පසු සිදුකර තිබිය යුතු අතර, අනෙක් බරපතළ අපරාධය එකී පළමු බරපතළ අපරාධය සිදුකිරීමෙන් පසු වසර දහයක් ඇතුළත (යම් බන්ධනාගාරගත කිරීමේ කාලසීමාවක් හැර) සිදුකර තිබිය යුතු ය.

සිද්ධියක් පිළිබඳ අවබෝධයක් තිබිය හැකි තැනැත්තකු වන විට

**13.** (1) මේ පනතේ කාර්යයන් සඳහා -

(අ) ඒ තැනැත්තාට ඒ සිද්ධිය පිළිබඳ සැබෑ අවබෝධයක් ඇත්නම්; හෝ

(ආ) (i) ඒ සිද්ධිය නොනැසී පැවතීමේ සාධාරණ හැකියාවක් පවතින බවට ඒ තැනැත්තා විශ්වාස කරන බවට; සහ

(ii) ඒ සිද්ධිය පවතින බව ස්ථිර කර ගැනීම පිණිස අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට ඒ තැනැත්තා අපොහොසත් වී ඇති බවට,

අධිකරණය විසින් සෑහීමට පත් වේ නම්,

සිද්ධියක් පිළිබඳ අවබෝධයක් තැනැත්තකුට ඇතැයි කියනු ලැබේ.

(2) මේ පනතේ කාර්ය සඳහා, සිද්ධියක් පවතින්නේ යැයි තැනැත්තකුට විශ්වාස කිරීමට හේතු ඇත්තේ යැයි කියනු ලබන්නේ, ඒ තැනැත්තා විසින් එළඹිය යුතුව තිබූ තීරණ-

(අ) එම තැනැත්තාගේ තත්ත්වය අනුව එම තැනැත්තාගෙන් සාධාරණ ලෙස බලාපොරොත්තු විය හැකි දැනුම, කුසලතාවය, පුහුණුව හා පළපුරුද්ද; සහ

(ආ) ඇත්ත වශයෙන් ම ඒ තැනැත්තා සතු දැනුම, කුසලතාවය, පුහුණුව හා පළපුරුද්ද,

යන කරුණු දෙක ම ඇත්තා වූ සාධාරණ ලෙස උද්යෝගයක් හා පරික්ෂාවකින් යුතු තැනැත්තකු විසින් එළඹිය හැකි තීරණ වන්නේ නම් වේ.

මේ පනත යටතේ බරපතළ අපරාධයකට අදාළ කාරණා ප්‍රකාශයට පත් කිරීම

**14.** (1) (මේ වගන්තියේ "වින්දිතයා" යනුවෙන් සඳහන් කරනු ලබන) මේ පනත යටතේ යම් තැනැත්තකුට එරෙහිව බරපතළ අපරාධයක් සිදු කර ඇතැයි කියනු ලබන හෝ යම් තැනැත්තකුට එරෙහිව බරපතළ අපරාධයක් සිදු කරනු ලැබ ඇති බවට සොයාගෙන ඇති යම් තැනැත්තකුගේ අනන්‍යතාවය හෙළිදරව් විය හැකි වන්නා වූ නාමයක්, හෝ අනන්‍යතාවය හෙළිදරව් කරනු ලැබිය හැකි වෙනත් කාරණයක් හෙළිදරව් කරනු ලබන යම් තැනැත්තකු වරදක් කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබීමේ දී වසර දෙකකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දෙකට ම හෝ යටත් විය යුතු ය.

(2) වින්දිතයකුගේ අනන්‍යතාවය හෙළිදරව් විය හැකි වන්නා වූ යම් නාමයක් හෝ යම් කාරණයක් මුද්‍රණය කිරීමකට හෝ

ප්‍රසිද්ධියට පත් කිරීමකට අදාළව ඒ මුද්‍රණය කිරීම හෝ ප්‍රසිද්ධ කිරීම -

(අ) විමර්ශන කාර්යයක් සඳහා සද්භාවයෙන් කටයුතු කරමින් බරපතළ අපරාධයක් පිළිබඳ විමර්ශනයක් පවත්වන පොලිස් ස්ථානය භාර නිලධරයාගේ හෝ පොලිස් නිලධරයකුගේ නියෝගය අනුව හෝ නියෝගයක් යටතේ; හෝ

(ආ) වින්දිතයාගේ ලිඛිත බලය පැවරීමක් මගින් හෝ ඒ අනුව; හෝ

(ඇ) වින්දිතයා මියගොස් සිටින අවස්ථාවක වින්දිතයාගේ ළඟ ම ඥාතියකු විසින් හෝ වින්දිතයා බාලවයස්කාරයකු හෝ සිහිවිකල තැනැත්තකු වන අවස්ථාවක වින්දිතයාගේ මව්පියන් හෝ භාරකරුවකු විසින් ලිඛිත බලය පැවරීමක් මගින් හෝ ඒ අනුව,

සිදු කර ඇත්නම්, (1) වන උපවගන්තියේ සඳහන් කරුණු කිසිවක් ඒ සම්බන්ධයෙන් අදාළ කර ගනු නොලැබිය යුතු ය:

එසේ වුව ද, යම් ලිඛිත නීතියක් යටතේ සංස්ථාගත කළ හෝ ලියාපදිංචි කළ යම් සුභසාධන ආයතනයක හෝ සංවිධානයක කවර හෝ ආකාරයකින් විස්තර කරනු ලැබිය හැකි සභාපතිවරයා, ලේකම්වරයා හෝ කළමනාකරු නොවන යම් තැනැත්තකු වෙත එම ළඟම ඥාතියා විසින් එම ලිඛිත පැවරීම ලබා නොදිය යුතු ය.

(3) යම් අධිකරණයක පූර්ව අවසරය නොමැතිව මේ පනත යටතේ බරපතළ අපරාධයකට අදාළව යම් අධිකරණයක පැවැත්වෙන නඩු කටයුත්තක් සම්බන්ධයෙන් යම් කාරණයක් මුද්‍රණය කරන හෝ ප්‍රසිද්ධියට පත් කරන යම් තැනැත්තකු විසින් වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත් අධිකරණයක් ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබීමේ දී වසර දෙකකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන්

එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දෙකට ම හෝ යටත් විය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයක් විසින් සිදු කරනු ලැබූ බරපතළ අපරාධය

**15.** (1) සංස්ථාපිත පුද්ගල මණ්ඩලයක් විසින් බරපතළ අපරාධයක් සිදු කරනු ලැබූ අවස්ථාවක, සංස්ථාපිත මණ්ඩලයට අමතරව ඒ බරපතළ අපරාධය සිදු කරන අවස්ථාවේ දී ඒ සංස්ථාපිත මණ්ඩලයේ සියලු අධ්‍යක්ෂවරු, අදාළ බරපතළ අපරාධය සංස්ථාපනය වන්නා වූ ක්‍රියාව සිදු කිරීම සඳහා එකී එක් එක් අධ්‍යක්ෂවරයා විසින් වගකීමක් භාර නොගත යුතු වුව ද, එය නොතකා ඒ බරපතළ අපරාධය සිදු කිරීම සඳහා වෙන් වෙන්ව වගකීමට බැඳී සිටිය යුතු ය:

එසේ වුව ද -

(අ) එකී අධ්‍යක්ෂවරයා ඔහුගේ දැනුම්වත්භාවයක් නොමැතිව ඒ බරපතළ අපරාධය සිදු කර ඇති බවට හෝ ඒ බරපතළ අපරාධය සිදු කිරීම වළක්වා ගැනීමට ඔහු නිසි උද්යෝගයෙන් ක්‍රියා කර ඇති බවට විමර්ශනය පවත්වන විමර්ශන නිලධරයාට කරුණු පහදා ඇත්නම්, ඔහුට එරෙහිව නඩු පවරනු නොලැබිය යුතු ය; හෝ

(ආ) එකී අධ්‍යක්ෂවරයා විසින් ඔහුගේ දැනුම්වත්භාවයක් නොමැතිව ඒ බරපතළ අපරාධය සිදු කර ඇති බවට හෝ ඒ බරපතළ අපරාධය සිදු කිරීම වළක්වා ගැනීමට ඔහු නිසි උද්යෝගයෙන් ක්‍රියා කර ඇති බවට සම්භාව්‍යතා වැඩි බර අනුව, අධිකරණය ඉදිරියෙහි ඔප්පු කර ඇත්නම්, ඔහු බරපතළ අපරාධයක් සිදු කිරීමට වරදකරුවකු ලෙස සලකනු නොලැබිය යුතු ය.

(2) සංස්ථාපිත පුද්ගල මණ්ඩලයක අධ්‍යක්ෂවරුන්ට එරෙහිව අපරාධ නඩු කටයුත්තක් පැවරීමේ කාර්යය සඳහා අනුරූප සංස්ථාපිත පුද්ගල මණ්ඩලයකට එරෙහිව පළමු අවස්ථාවේ නඩු පවරා වරදකරුවකු බවට එළඹීම අවශ්‍ය නොවිය යුතු ය.

නෛතික තැනැත්තකු වෙනුවෙන් ක්‍රියා කරන ජ්‍යෙෂ්ඨ නිලධරයකු වෙනුවෙන් නෛතික තැනැත්තා වගකිවයුතු බව හා වෙනත් දේ

**16.** (1) නෛතික තැනැත්තා වෙනුවෙන් හෝ නෛතික තැනැත්තාගේ වාසිය වෙනුවෙන් ක්‍රියාකරමින් -

(අ) බරපතළ අපරාධය සිදු කරන;

(ආ) දැන දැනම බරපතළ අපරාධයක් සිදු කිරීමට බලය දෙන හෝ අවසරය දෙන; හෝ

(ඇ) නෛතික තැනැත්තා වෙනුවෙන් හෝ නෛතික තැනැත්තාගේ යහපත වෙනුවෙන් බරපතළ අපරාධයක් සිදුවන බව දැන දැනම හෝ එම කරුණ පිළිබඳව කැමැත්තෙන් ම සත්‍යය වසන්කොට හෝ නොසැලකිලිමත්ව සාධාරණ පියවර ගැනීමට සහ සුදුසු ආයතනික කළමනාකරණය මාදිලියක් තෝරාගෙන ඵලදායී ලෙස ක්‍රියාවෙහි යෙදවීමට අපොහොසත් වීම තුළින් බරපතළ අපරාධය සිදුවීම වැළැක්වීමට නිසි පියවර නොගන්නා,

නෛතික තැනැත්තකුගේ ජ්‍යෙෂ්ඨ නිලධරයකු සිදු කරන එකී බරපතළ අපරාධයට නෛතික තැනැත්තා වගකිය යුතු ය.

(2) මේ පනත යටතේ වන බරපතළ අපරාධයකට වරදකරු වන නෛතික තැනැත්තකු පහත දැක්වෙන දඬුවම් එකකට හෝ ඊට වැඩි ප්‍රමාණයකට යටත් විය යුතු ය:-

(අ) (i) රුපියල් මිලියනයක් නොඉක්මවන; හෝ

(ii) ලබාගත් වාසියේ මුළු වටිනාකම හෝ බරපතළ අපරාධයට සාධාරණ ලෙස ආරෝපණය කළ හැකි සිදු වූ අලාභය මෙන් තුන් ගුණයක් නොඉක්මවන,

දඩයක්;

(ආ) සුදුසු පරිදි බරපතළ අපරාධයේ විස්තර සහ පනවන ලද යම් දඬුවමක ස්වභාවය ද ඇතුළත්ව අධිකරණය

විසින් ලබා දුන් නඩු තීන්දුව ප්‍රකාශයට පත් කරන ලෙස නෛතික තැනැත්තාට නියම කිරීම;

(ඇ) පොදු යහපත සඳහා සඳහන් කරනු ලබන ව්‍යාපෘතියක් ක්‍රියාවට නගන ලෙස නෛතික තැනැත්තාට නියම කිරීම;

(ඈ) නෛතික තැනැත්තා අධිකරණයේ අධීක්ෂණය යටතේ වසර පහක් නොඉක්මවන කාලසීමාවක් සඳහා තැබීමට නියම කිරීම;

(ඉ) ප්‍රශ්නගත බරපතළ අපරාධ සිදු කිරීමට භාවිත කළ නෛතික තැනැත්තාගේ ආයතන තාවකාලිකව හෝ ස්ථිරව ම වසා දමන ලෙසට නියම කිරීම;

(ඊ) නෛතික තැනැත්තා තාවකාලිකව හෝ ස්ථිර ම පොදු ලංසු තැබීමට, පොදු වාසි හෝ ආධාරවලට සුදුසුකම් ලැබීමට හෝ පොදු ප්‍රසම්පාදන කටයුතුවලට සහභාගී වීමට නොසුදුසු බවට නියම කිරීම;

(උ) තාවකාලිකව හෝ ස්ථිරව ම නෛතික තැනැත්තා වෙනත් ව්‍යාපාරික කටයුතුවල නිරත වීමට හෝ තවත් නෛතික තැනැත්තකු නිර්මාණය කිරීමට නුසුදුස්සකු කිරීම හෝ;

(ඌ) නෛතික තැනැත්තා සම්පූර්ණයෙන් ම හෝ ප්‍රමුඛව යෙදී සිටින කාර්යය බරපතළ අපරාධ සිදු කිරීම වන්නේ නම් හෝ මේ පනත යටතේ වන බරපතළ අපරාධයක් සිදු කිරීම සඳහා නෛතික තැනැත්තා නිර්මාණය කර තිබේ නම් හෝ නෛතික තැනැත්තා විසිරුවා හැරීමට නියම කිරීම; සහ

(එ) යුක්ති සහගත යැයි අධිකරණය විසින් සලකනු ලබන අතිරේක නියම.

(3) මේ වගන්තියේ කාර්යය සඳහා “ජ්‍යෙෂ්ඨ නිලධරයා” යන්නෙන්, එකී තැනැත්තාගේ ක්‍රියාකලාපය මගින් නෛතික තැනැත්තාගේ ප්‍රතිපත්ති නියෝජනය කරතැයි සාධාරණ ලෙස උපකල්පනය කරනු ලැබිය හැකි ආකාරයේ යම් වගකීමක් සහිත කාර්යය ඉටු කරන නෛතික තැනැත්තාගේ සේවා නියුක්තිකයකු, නියෝජිතයකු හෝ නිලධරයකු අදහස් වේ.

## II වන කොටස

### විමර්ශන සහ නඩු පැවරීම්

නැවැත්වීම හා සෝදිසි කිරීම ආදියට ඇති බලය

**17.** (1) මේ පනත යටතේ බරපතළ අපරාධයක් සිදු කිරීම පිළිබඳ සාධාරණ සැකයක් පවතින අවස්ථාවක, පොලිස් නිලධරයකු විසින්, පහත දැක්වෙන කරුණු එනම් -

(අ) යම් සැකකරුවකු, වාහනයක්, යාත්‍රාවක්, දුම්රියක්, ගුවන් යානයක් හෝ රියදුරකු රහිත ආකාශික වාහනයක් නැවැත්වීම සහ සෝදිසි කිරීම:

එසේ වුව ද, යම් යාත්‍රාවක් හෝ ගුවන් යානයක් නවත්වන හෝ සෝදිසි කරන අවස්ථාවක 38 වන, 39 වන සහ 40 වන වගන්තිවල විධිවිධාන අදාළ කරගත ලැබිය යුතු ය;

(ආ) යම් සැකකරුවකුගෙන් ප්‍රශ්න කිරීම;

(ඇ) සෝදිසි වරෙන්තුවක් නොමැතිව යම් පරිශ්‍රයකට හෝ ඉඩමකට ඇතුළු වී සෝදිසි කිරීම;

(ඈ) යම් තැනැත්තකු අත්අඩංගුවට ගැනීම; හෝ

(ඉ) මේ පනත යටතේ වන යම් බරපතළ අපරාධයක් සිදු කිරීමේ දී භාවිත කළ, ඒවායින් ව්‍යුත්පන්න වූ, ඒවාට සම්බන්ධිත හෝ අදාළ හෝ එවැනි වරදක් සිදු කිරීමේ දී භාවිත කරමින් පැවති, ඒවායින් ව්‍යුත්පන්න වෙමින්

පැවති, ඒවාට සම්බන්ධිතව හෝ අදාළව පැවති බවට සාධාරණව සැකකරන ලද යම් ලේඛනයක්, ද්‍රව්‍යයක් හෝ භාණ්ඩයක් පොලීසිය භාරයට ගැනීම,

ඇතුළු යම් පියවර ගනු ලැබිය හැකි ය.

(2) ගුවන් යානයක් හෝ යාත්‍රාවක් සම්බන්ධව (1) වන උපවගන්තිය යටතේ පවරන ලද බලතල පොලිස් නිලධරයකු විසින් ක්‍රියාත්මක කරන අවස්ථාවක දී (351 වන අධිකාරය වූ) ආගාමික සහ විගාමික පනතේ විධිවිධාන අදාළ කරගනු ලැබිය යුතු ය.

(3) එසේ පොලීසිය භාරයට ගන්නා ලද එවැනි යම් ලේඛනයක්, ද්‍රව්‍යයක් හෝ භාණ්ඩයක් ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මනින් අදාළ පොලිස් නිලධරයා අනුයුක්ත කර ඇති පොලිස් ස්ථානය භාර නිලධරයා වෙත හෝ ආසන්නත ම පොලිස් ස්ථානය භාර නිලධරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තියේ දක්වා ඇති පොලිස් ස්ථානය භාර නිලධරයා විසින්, අදාළ ලේඛනය, දෙය හෝ ද්‍රව්‍යය ඉදිරිපත් කරනු ලැබුවේ යම් මහෙස්ත්‍රාත්වරයකු වෙත ද එම මහෙස්ත්‍රාත්වරයා වෙත ඒ සම්බන්ධයෙන් වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එකී මහෙස්ත්‍රාත්වරයා විසින්, එසේ භාරයට ගනු ලැබූ යම් ලේඛනයක්, දෙයක් හෝ ද්‍රව්‍යයක් සම්බන්ධයෙන් උචිත ආඥාවක් කරනු ලැබිය යුතු ය.

අත්අඩංගුවට ගැනීමක් සිදුකිරීම ආදියේ දී කාර්යපටිපාටිය

**18.** (1) මේ පනත යටතේ අත්අඩංගුවට ගැනීමක් සිදු කරනු ලැබූ පොලිස් නිලධරයකු විසින් නොපමාව එසේ අත්අඩංගුවට ගත් සැකකරු ඒ පොලිස් නිලධරයා අනුයුක්තව සිටින්නා වූ පොලිස් ස්ථානය භාර පොලිස් නිලධරයා වෙත හෝ ආසන්නතම පොලිස් ස්ථානය භාර නිලධරයා වෙත භාර දෙනු ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ වන අත්අඩංගුවට ගැනීමක් සිදු කිරීමට හෝ අත්අඩංගුවට ගනු ලැබූ සැකකරු පොලිස් ස්ථානයක් වෙත රැගෙන යාමට පොලිස් නිලධරයකු විසින් සන්නද්ධ හමුදාවන්හි

සාමාජිකයකුගේ හෝ වෙරළ ආරක්ෂක නිලධරයකුගේ හෝ සහාය ලබා ගැනීම නීත්‍යානුකූල විය යුතු ය.

අත්අඩංගුවට ගැනීම පිළිබඳ දැනුම් දීම

**19.** (1) මේ පනත යටතේ යම් සැකකරුවකු අත්අඩංගුවට ගනු ලැබූ අවස්ථාවක දී අත්අඩංගුවට ගන්නා නිලධරයා විසින් එසේ අත්අඩංගුවට ගත් බව පිළිදන්වමින් වහා ම හෝ කවර විටක දී වුව ද අත්අඩංගුවට ගනු ලැබූ අවස්ථාවේ සිට පැය විසිහතරක් පසු නොවන කාලයක් තුළ දී සැකකරුගේ ළඟම ඥාතියාට දෙවන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට සාරානුකූලව වූ දැනුම් දීමක් කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, යම් සැකකරුවකු අත්අඩංගුවට ගෙන ඇත්තා වූ ද, මේ උපවගන්තයේ නිශ්චිතව දක්වා ඇති යම් දැනුම් දීමක් නිකුත් කිරීමට නොහැකි වූ ද අවස්ථාවක, අත්අඩංගුවට ගන්නා නිලධරයා විසින් එකී දැනුම් දීම නිකුත් කිරීමට නොහැක්කේ මන්ද යන්න පිළිබඳ හේතු දක්වමින් තොරතුරු සටහන් පොතේ සටහනක් ඇතුළත් කිරීම එම අත්අඩංගුවට ගන්නා නිලධරයාගේ කාර්යය විය යුතු අතර එකී දැනුම් දීම නිකුත් කිරීමට නොහැක්කේ මන්ද යන්න පිළිබඳව හේතු එකී සැකකරු ඉදිරිපත් කරනු ලැබුවේ යම් පොලිස් ස්ථානයක් භාර නිලධරයකු වෙත ද ඒ පොලිස් ස්ථානය භාර නිලධරයා වෙත වාර්තා කිරීම එකී පොලිස් නිලධරයාගේ කාර්යය විය යුතු අතර, එකී පොලිස් ස්ථානය භාර නිලධරයා විසින්, ඒ සඳහා වූ හේතු ද සමග ඒ පිළිබඳව තොරතුරු සටහන් පොතේ සටහනක් ඇතුළු ඇතුළත් කරනු ලැබිය යුතු ය.

(2) එම සැකකරුගේ ළඟම ඥාතියා නොසිටී නම්, (1) වන උපවගන්තියේ සඳහන් දැනුම් දීම භාරදිය යුතු වන්නා වූ යම් තැනැත්තකුගේ අනන්‍යතාවය සහ එම තැනැත්තා සිටින ස්ථානය සම්බන්ධයෙන් අත්අඩංගුවට ගන්නා නිලධරයා විසින් එම සැකකරුගෙන් විමසනු ලැබිය යුතු අතර, සැකකරු විසින් එකී තොරතුරු ලබාදෙන්නේ නම්, එම දැනුම් දීම එකී තැනැත්තා වෙත භාරදීම සඳහා හැකි සෑම පියවරක්ම ගනු ලැබිය යුතු ය. එකී දැනුම් දීමෙහි පිටපතක් සැකකරුට භාර දෙනු ලැබිය යුතු ය.

(3) සැකකරු අත්අඩංගුවේ තබා ගනු ලබන්නා වූ පොලිස් ස්ථානය භාර නිලධරයා විසින් ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මනින්

සහ කවර විටෙක දී වුව ද සැකකරු තමා වෙත ඉදිරිපත් කිරීමෙන් පැය විසිහතරක් පසු නොවන කාලයක් තුළ දී, එම අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් තුන්වන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට සාරානුකූලව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත දැනුම් දෙනු ලැබිය යුතු අතර, හතරවන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට සාරානුකූලව, පොලිස්පතිවරයා වෙත හෝ ඔහුගේ බලයලත් නියෝජිතයා වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.

(4) මේ පනත යටතේ අත්අඩංගුවට ගනු ලැබූ යම් සැකකරුවකු, එම සැකකරු මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කිරීමෙන් තොරව මුදා හරිනු නොලැබිය යුතු අතර, එම මුදාහැරීම පිළිබඳව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත දන්වනු ලැබිය යුතු ය.

මහෙස්ත්‍රාත්වරයකු වෙත ඉදිරිපත් කිරිම

**20.** (1) මේ පනත ප්‍රකාර පොලිස් නිලධරයකු විසින් අත්අඩංගුවට ගෙන භාරයේ තබාගෙන ඇත්තා වූ සැකකරුවකු එසේ අත්අඩංගුවට ගනු ලැබූ වෙලාවේ සිට පැය හැත්තෑ දෙකක් පසු නොවන කාලසීමාවක් තුළ නොපමාව ආසන්නතම මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, අත්අඩංගුවට ගැනීම ශ්‍රී ලංකාවේ දී සිදු කරනු ලැබ ඇති අවස්ථාවක, අදාළ මහෙස්ත්‍රාත්වරයා වෙතට ඒ තැනැත්තා අත්අඩංගුවට ගත් ස්ථානයේ සිට රැගෙන යාමට ගතවන කාලසීමාව ඉහත පැය හැත්තෑ දෙකක කාලසීමාව ගණනය කිරීමේ දී බැහැර කර ගණනය කරනු ලැබිය යුතු ය:

එසේ ම තවදුරටත්, අත්අඩංගුවට ගැනීම ශ්‍රී ලංකාවෙන් බැහැරව හෝ යම් ගුවන් යානයක් තුළ දී හෝ යාත්‍රාවක් තුළ දී හෝ සිදු කර ඇත්නම් ඒ තැනැත්තා අත්අඩංගුවට ගත් ස්ථානයේ සිට අදාළ මහෙස්ත්‍රාත්වරයා වෙත රැගෙන යාමට ගතවන කාලසීමාව ඒ පැය හැත්තෑ දෙකක කාලසීමාව ගණනය කිරීමේ දී බැහැර කර ගණනය කළ යුතු ය.

(2) මේ වගන්තිය යටතේ යම් සැකකරුවකු මහෙස්ත්‍රාත්වරයකු වෙත ඉදිරිපත් කිරීමෙන් පසු, වැඩිදුර විමර්ශන සිදු කිරීමේ කාර්යය

සඳහා සැකකරු වැඩිදුරටත් දීර්ඝ කරන ලද කාලයක් භාරයේ තබා ගැනීමට අවශ්‍ය බවට විශ්වාස කිරීමට එම විමර්ශනය සිදු කරනු ලබන පොලිස් නිලධරයාට සාධාරණ හේතු ඇති අවස්ථාවක දී, මහෙස්ත්‍රාත්වරයා විසින්, ලිඛිතව හේතු වාර්තා කරමින්, පැය විසිහතරක් නොඉක්මවන වැඩිදුර කාලසීමාවකට එම සැකකරු පොලිස් භාරයේ තැබීම සඳහා බලය දෙනු ලැබිය හැකි ය.

(3) (1) වන හෝ (2) වන උපවගන්ති යටතේ සැකකරුවකු මහෙස්ත්‍රාත්වරයකු වෙත ඉදිරිපත් කරනු ලබන විට සහ -

(අ) 21 වන වගන්තිය ප්‍රකාර රඳවා තැබීමේ නියමයක් ප්‍රථම වතාවට මාස දෙකක කාලසීමාවක් සඳහා නිකුත් කරනු ලැබ එය පරීක්ෂා කිරීම සඳහා මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබූ විට දී, මහෙස්ත්‍රාත්වරයා විසින් එම රඳවා තැබීමේ නියමය බලාත්මක කිරීම සඳහා ආඥාවක් කරනු ලැබිය යුතු අතර, එම රඳවා තැබීමේ නියමයේ පිටපතක්, සැකකරු රඳවා තබා සිටින ස්ථානයට ආසන්නතම මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය; හෝ

(ආ) රඳවා තැබීමේ නියමයක් මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කර නොමැති විට දී, මහෙස්ත්‍රාත්වරයා විසින් සැකකරු රිමාන්ඩ් භාරයේ තබනු ලැබිය යුතු ය.

(4) සැකකරුවා ඉදිරිපත් කරනු ලබන්නේ යම් මහෙස්ත්‍රාත්වරයකු වෙත ද, එම මහෙස්ත්‍රාත්වරයා විසින්, පෞද්ගලිකව, සැකකරු රහසිගතව හමු වී, ඔහුගේ යහපැවැත්ම පිළිබඳව සොයා බලා සැකකරු විසින් යම් ප්‍රකාශයක් ලබා දෙනු ලබන්නේ නම් එය වාර්තා කරනු ලැබිය යුතු ය.

රඳවා තැබීමේ නියම

**21.** (1) පොලිස්පතිවරයා හෝ තත්කාර්යය සඳහා පොලිස්පතිවරයා විසින් බලය දෙන ලද නියෝජ්‍ය පොලිස්පතිවරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන යම් නිලධරයකු විසින්, (4) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති

යම් කාර්යයක් සඳහා, මේ පනත යටතේ බරපතළ අපරාධයක් සිදු කිරීමට සම්බන්ධ වී ඇති හෝ එවැනි වරදක් සිදු කිරීමට අදාළ සැකකරුවකු පොලිස් ස්ථානයක රඳවා තැබීම සඳහා රඳවා තැබීමේ නියමයක් නිකුත් කිරීමට ලේකම්වරයා වෙත ලිඛිතව ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් ලැබීමෙන් පසු, (4) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති හේතුවලින් කිසිවක් මත සැකකරු රඳවා තැබිය යුතු බවට විශ්වාස කිරීමට සාධාරණ හේතු ඇති බවට ලේකම්වරයා සෑහීමකට පත් වන අවස්ථාවක දී, ඔහු විසින්, එකී හේතු වාර්තාගත කිරීමෙන් පසු, සැකකරු රඳවා තැබීම සඳහා බලය දෙමින් පස්වන උපලේඛනයේ දක්වා ඇති ආකෘති පත්‍රයේ සාරානුකූලව රඳවා තැබීමේ නියමයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තිය යටතේ නිකුත් කරනු ලබන සෑම රඳවා තැබීමේ නියමයක් ම වරකට මාස දෙකක් නොඉක්මවන කාලසීමාවක් සඳහා නිකුත් කරන කරනු ලැබිය හැකි අතර ඒ රඳවා තැබීමේ නියම යටතේ සමස්ත රඳවා තබා ගැනීමේ කාලසීමාව (1) වන උපවගන්තිය යටතේ සැකකරු රඳවා තබා ගැනීමේ කාර්යය සඳහා නිකුත් කරන ලද පූර්ව රඳවා තබා ගැනීමේ නියමයේ දිනයේ සිට එක් අවුරුද්දක් නොඉක්මවනු ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ වන රඳවා තැබීමේ නියමයක් එය නිකුත් කිරීමේ දී ඒ සඳහා වූ හේතු දැක්විය යුතු අතර පහත සඳහන් කාර්යයන් එකක් හෝ කිහිපයක් මත, එනම් -

(අ) සැකකරු සම්බන්ධයෙන් විමර්ශන කටයුතු සිදු කිරීමට පහසුකම් සැලසීම;

(ආ) මේ පනත යටතේ සිදු කරන ලද බරපතළ අපරාධයකට අදාළව විමර්ශනයකට ද්‍රව්‍ය ලබා ගැනීම සහ අවශ්‍ය විය හැකි සාක්ෂි ලබා ගැනීම; හෝ

(ඇ) රඳවා තබා සිටින සැකකරුගෙන් ප්‍රශ්න කිරීම,

සඳහා අවශ්‍ය වන අවස්ථාවක දී නිකුත් කරනු ලැබිය යුතු ය.

(5) 20 වන වගන්තිය යටතේ අදාළ සැකකරු මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාව වන විට රඳවා තැබීමේ නියමයක් නිකුත් කර ඇති විට දී, රඳවා තැබීමේ නියමයේ සහතික කළ පිටපතක් පරීක්ෂා කිරීම සඳහා මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(6) මේ වගන්තිය යටතේ වන රඳවා තැබීමේ නියමයක පිටපතක්, රඳවා තබා ඇති සැකකරුට, එම රඳවා තැබීමේ නියමය නිකුත් කිරීමෙන් පැය හැත්තෑ දෙකක කාලසීමාවක් ඇතුළත භාරදිය යුතු අතර, සැකකරු විසින් එය භාරගත් බවට වන පිළිදැන්වීමක් ලබාගෙන එය අදාළ මහෙස්ත්‍රාත් අධිකරණයෙහි ගොනු කරනු ලැබිය යුතු ය.

(7) රඳවා තැබීමේ නියමයෙහි පිටපතක් සැකකරුගේ ළඟම ඥාතියාට එම රඳවා තැබීමේ නියමය නිකුත් කිරීමෙන් දින හතක කාලසීමාවක් ඇතුළත භාරදිය යුතු ය.

රඳවා තබා ගැනීමේ කාල සීමාව දීර්ඝ කිරීම

**22.** (1) 20 වන වගන්තියේ තුන්වන (3) වන උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් රඳවා තැබීමේ කාලසීමාව ඉක්මවා සැකකරු රඳවා තැබීමට අවශ්‍ය වන අවස්ථාවක දී, එම කාලසීමාව අවසන් වීමෙන් පසු, 21 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද රඳවා තැබීමේ නියමය සමග සැකකරු මහාධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එම සැකකරුගේ රඳවා තැබීමේ කාලසීමාව දීර්ඝ කිරීම සඳහා වන රඳවා තැබීමේ නියමය බලාත්මක කිරීමට ආඥාවක් කිරීම සඳහා නීතිපතිවරයා මගින් මහාධිකරණය වෙත අදාළ පොලිස් ස්ථානය භාර නිලධරයා විසින් ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(2) මහාධිකරණය විසින්, රඳවා තැබීමේ කාල සීමාවේ දීර්ඝ කිරීම බලාත්මක කිරීමේ ආඥාවක් සඳහා වූ ඉල්ලීමේ සහායට ඉදිරිපත් කරන ලද කරුණු දැක්වීම් සහ එකී රඳවා තැබීමේ නියමය දීර්ඝ කිරීම සම්බන්ධයෙන් සැකකරු හෝ ඔහුගේ නීතිඥවරයා විසින් ඉදිරිපත් කරන ලද විරෝධතා ද වාර්තාගත කරනු ලැබිය යුතු ය.

(3) විමර්ශන කාර්ය සඳහා කරුණු දැක්වීමේ රහස්‍යභාවය පිළිපැදීමේ අවශ්‍යතාවක් ඇති විට දී, ඒ සම්බන්ධව මහාධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබිය යුතු අතර ඒ අනුව මහාධිකරණය විසින් යෝග්‍ය ආඥාවක් ලබා දෙනු ලැබිය හැකි ය.

(4) (2) වන උපවගන්තිය යටතේ කරන ලද කරුණු දැක්වීම් සලකා බලමින්, මහාධිකරණය විසින් -

(අ) නියමයේ නිශ්චිතව දක්වා ඇති වැඩිදුර කාල සීමාවකට රඳවා තැබීමේ නියමය බලාත්මක කිරීම සඳහා ආඥාවක් කරනු ලැබිය හැකි ය; හෝ

(ආ) හේතු දක්වමින් රඳවා තැබීමේ නියමය බලාත්මක කිරීම ප්‍රතික්ෂේප කළ හැකි අතර පරීක්ෂණයකින් පසු, සැකකරු රිමාන්ඩ් භාරයේ තැබීම හෝ ඇප මත මුදා හැරීම කරනු ලැබිය හැකි ය.

(5) මේ වගන්තිය යටතේ වන නඩු කටයුතු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 106 වන ව්‍යවස්ථාවේ ප්‍රතිපාදනවලට යටත්ව, රහසිගතව පවත්වනු ලැබිය හැකි ය.

සැකකරුවකු ඇප මත මුදා හැරිය හැකි බව

**23.** (1) 20 වන වගන්තියේ (3) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ රිමාන්ඩ් භාරයේ තබන ලද සැකකරුවකු මහාධිකරණය විසින් ඇප මත මුදා හරිනු ලැබිය හැකි ය:

එසේ වුව ද, මේ පනත යටතේ ජීවිතාන්තය දක්වා වූ සිරදඬුවමකින් හෝ මරණීය දඬුවමින් දඬුවම් ලැබිය හැකි බරපතළ අපරාධයක් සිදු කරමින් සිටීම හෝ බරපතළ අපරාධයක් සිදු කිරීම පිළිබඳ සැලකිල්ලට භාජනය වන සැකකරුවකු මහාධිකරණය විසින් විශේෂ අවස්ථානුගත අවස්ථාවල දී පමණක් ඇප මත මුදා හරිනු ලැබිය හැකි ය.

(2) යම් සැකකරුවකු ඔහු පළමුවරට රිමාන්ඩ් භාරයට පත් කරන ලද දිනයේ සිට වසරක් ඉක්මවන කාලසීමාවක් සඳහා, මේ පනත යටතේ වන බරපතළ අපරාධයක් සම්බන්ධයෙන් රිමාන්ඩ් භාරයේ නොතැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් කාලසීමාව ඇතුළත යම් අධිචෝදනා පත්‍රයක් ඉදිරිපත් කර නොමැති අවස්ථාවක දී, මහාධිකරණය විසින්, සැකකරු ඇප මත මුදා හරිනු ලැබිය යුතු ය.

**24.** (1) නියෝජ්‍ය පොලිස්පතිවරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන පොලිස් නිලධරයකු විසින් ඉල්ලීමක් කිරීමේ දී, මහෙස්ත්‍රාත්වරයා හමුවේ ඉදිරිපත් කර ඇති කරුණු මත පදනම්ව - සීමා කිරීමේ ආඥා

(අ) මේ පනත යටතේ බරපතළ අපරාධයක් කිරීමෙහි යෙදෙන්නා වූ, යෙදී ඇති හෝ යෙදීමට සූදානම් වන්නා වූ තැනැත්තකු වන බවට;

(ආ) ඒ බරපතළ අපරාධය සිදු කිරීමේ හෝ ඒ බරපතළ අපරාධය සිදු කිරීමට පහසුකම් සැලසීමේ විශ්වසනීය සහ බරපතළ අවධානමක් ඒ තැනැත්තා පෙන්වන බවට; සහ

(ඇ) බරපතළ අපරාධය සිදු කිරීම වැළැක්වීමේ කාර්යය සඳහා සීමා කිරීමේ ආඥාව අවශ්‍ය වන බවට සහ ඌන සීමා කිරීමේ පියවර ඵලදායි නොවන බවට,

මහෙස්ත්‍රාත්වරයා සෑහීමට පත්වන අවස්ථාවක දී, අවස්ථානුගත කරුණුවල දී අවශ්‍ය සහ සමානුපාත වන ආකාරයේ කොන්දේසි පනවමින් මහෙස්ත්‍රාත්වරයා විසින් සීමා කිරීමේ ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ආඥාවක් කරන්නේ ද නැද්ද යන්න නිශ්චය කිරීමේ දී මහෙස්ත්‍රාත්වරයා විසින් පහත දැක්වෙන කරුණු පිළිබඳව සැලකිල්ලට ගනු ලැබිය යුතු ය:-

(අ) යෝජනා කරන ලද එක් එක් සීමා කිරීමක අවශ්‍යතාවය සහ සමානුපාතිකත්වය;

(ආ) තිබෙන අවදානමේ ස්වභාවය සහ බරපතළ බව;

(ඇ) යෝජිත සීමාකිරීම්වලින් අදාළ තැනැත්තාගේ මූලික අයිතිවාසිකම් සහ නිදහස මත ඇතිවිය හැකි බලපෑම; සහ

(ඈ) ආවේක්ෂණය, අධීක්ෂණය හෝ නියමයන් වාර්තා කිරීම ඇතුළත්ව, ඌන මැදිහත්වීමේ පියවර මගින් අරමුණ සාක්ෂාත් කරගත හැකි ද යන්න.

(3) (අ) නිශ්චිතව දක්වන ලද ස්ථාන හෝ ප්‍රදේශවලට යාම සීමා කිරීම;

(ආ) නිශ්චිතව දක්වන ලද කාල පරාසයන්වල දී නිශ්චිතව දක්වන ලද පොලිස් ස්ථානයකට වාර්තා කිරීමේ නියම;

(ඇ) මේ පනත යටතේ වන බරපතළ අපරාධයක් සමග සම්බන්ධතාවයක් ඇති බවට සාධාරණ ලෙස විශ්වාස කරනු ලබන නිශ්චිතව දක්වන ලද තැනැත්තන් හෝ අස්ථිත්වයන් සමග සන්නිවේදනය කිරීම හෝ ආශ්‍රය කිරීම සීමා කිරීම; හෝ

(ඈ) අවශ්‍ය සහ සමානුපාතික බවට මහෙස්ත්‍රාත්වරයා විසින් සලකනු ලබන වෙනත් යම් සීමා කරන ලද කොන්දේසි,

ඇතුළත්ව, සීමා කිරීමේ ආඥාවක් මගින් (1) වන උපවගන්තියේ සඳහන් අරමුණු සඳහා අතිශයින් ම අවශ්‍ය වන යම් පියවර පමණක් පැනවිය හැකි ය.

(4) කිසිදු සීමා කිරීමේ ආඥාවක් මගින්-

(අ) හඳුනාගත් අවදානමට දැඩි ලෙස අවශ්‍ය වන සහ සමානුපාත වන තාක් දුරට හැර, යාම් ඊම්, අදහස් ප්‍රකාශ කිරීම, රැස්වීම හෝ සමාගමය මත පොදු තහනමක් පැනවීම; හෝ

(ආ) සාමාන්‍යයෙන් විමර්ශනයකට පහසුකම් සැලසීමේ හෝ සහාය වීමේ කාර්යය සඳහා ම පමණක් ඒ ආඥාව කිරීම,

නොකළ යුතු ය.

(5) සෑම සීමා කිරීමේ ආඥාවක් ම -

(අ) වරකට මාස තුනකට නොවැඩි කාලසීමාවක් සඳහා කරනු ලැබිය යුතු ය;

(ආ) ආඥාව සඳහා හේතු සහ එය පදනම් වූ ප්‍රධාන පදනම් නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය; සහ

(ඇ) බලපෑමට ලක් වූ තැනැත්තා විසින් කරනු ලබන ඉල්ලීමක් මත මහෙස්ත්‍රාත්වරයා විසින් කරනු ලබන සමාලෝචනය කිරීමකට යටත් විය යුතු ය.

(6) හදිසි අවස්ථානුගත කරුණුවලට අනුව ආඥාව ඒකපාර්ශ්වික සිදුකිරීමට අවශ්‍ය වන බවට වන වාර්තාගත කරුණු අනුව මහෙස්ත්‍රාත්වරයා විසින් නිශ්චය කරන්නෙ නම් හැර, සීමා කිරීමේ ආඥාවක් ඉල්ලා සිටින්නේ යම් තැනැත්තකුට එරෙහිව ද, ඒ තැනැත්තා විසින් කරුණු ඉදිරිපත් කිරීමට සහ නීතිඥවරයකු මාර්ගයෙන් පෙනී සිටීමට සාධාරණ අවස්ථාවක් ඒ තැනැත්තා වෙත ලබා දිය යුතු අතර, හදිසි අවස්ථානුගත අවස්ථාවක දී, හැකි මුල් ම අවස්ථාවේ දී කරුණු ඉදිරිපත් කිරීමට ඒ තැනැත්තාට අවස්ථාවක් සලස්වනු ලැබිය යුතු ය.

(7) සීමා කිරීමේ ආඥාවක් මගින් අතෘප්තියට පත් වන යම් තැනැත්තකු විසින් ඒ ආඥාව ප්‍රතිශෝධනය කිරීම සඳහා හෝ අධිකරණ සමාලෝචනය කිරීම සඳහා මහාධිකරණය හෝ අභියාචනාධිකරණය වෙත අභියාචනය කරනු ලැබිය හැකි ය.

(8) සීමා කිරීමේ ආඥාව ප්‍රත්‍යාදිෂ්ඨ කරනු ලබන අවස්ථාවක දී හෝ සාධාරණ හේතුවලින් තොරව සිදුකර ඇති බවට අනාවරණය

වන අවස්ථාවක දී, බලපෑමට ලක් වූ තැනැත්තා නීතිය අනුව සුදුසු සහනයක් ඉල්ලා සිටීමට හිමිකම් ලැබිය යුතු ය.

රිමාන්ඩ් භාරයේ තැබීම අතරතුර රඳවා තැබීම

**25.** (1) මේ පනත යටතේ වන බරපතළ අපරාධයකට හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ වන වරදකට රිමාන්ඩ් භාරයේ තබනු ලැබූ යම් තැනැත්තකු -

(අ) මේ පනත යටතේ බරපතළ අපරාධයක් සිදු කර ඇති බවට;

(ආ) මේ පනත යටතේ බරපතළ අපරාධයක් සිදු කිරීමට තැත් කර ඇති බවට, අනුබල දී ඇති බවට, කුමන්ත්‍රණය කර ඇති බවට, සංවිධානය කර ඇති බවට, පහසුකම් සලස්වා ඇති බවට, උපදෙස් දී ඇති බවට, කූට්ටනය කර ඇති බවට, විධානය කර ඇති බවට, ආධාර කර ඇති බවට, දිරි දී ඇති බවට, පොළඹවා ඇති බවට, උනන්දු කර ඇති බවට, අණකර ඇති බවට, උපදේශනය කර ඇති බවට හෝ සූදානම් කර ඇති බවට හෝ මේ පනත යටතේ වන බරපතළ අපරාධයක් සිදු කිරීමට සූදානමින් යම් ආරම්භක ක්‍රියාවක් සිදු කර ඇති බවට; හෝ

(ඇ) අත්අඩංගුවට ගැනීමට පෙරාතුව, මේ පනත යටතේ බරපතළ අපරාධයක් සිදු කර ඇති බවට සහ එකී පොලිස් ස්ථානය භාර නිලධරයා එම කරුණු දැන නොසිටි බවට,

පොලිස් ස්ථානය භාර නිලධරයා වෙත විශ්වසනීය තොරතුරු ලැබුණු අවස්ථාවක දී, එම පොලිස් ස්ථානය භාර නිලධරයා විසින් එම තොරතුරු නීතිපතිවරයා වෙත වාර්තා කරනු ලැබිය යුතු ය.

(2) මහාධිකරණ විනිශ්චයකාරවරයා විසින්, නීතිපතිවරයා විසින් කරනු ලබන ඉල්ලීමක් මත, එම තොරතුරු පිළිබඳ වහාම පරීක්ෂා කරනු ලැබිය යුතු අතර, පරීක්ෂණය අවසානයේ දී, සැකකරුට විරුද්ධව ඇති චෝදනාව ප්‍රබල සාක්ෂි මත පදනම් වී ඇති බවට මහාධිකරණ විනිශ්චකාරවරයා සෑහීමට පත් වන්නේ

නම් සහ සැකකරු වැඩිදුර විමර්ශන සඳහා රැඳවුම් භාරයේ තැබීම යෝග්‍ය වන්නේ නම් මහාධිකරණ විනිශ්චයකාරවරයා විසින්, රඳවා තැබීමේ නියමයක් ඉදිරිපත් කරනු ලැබූ විට, රඳවා තැබීමේ නියමය බලාත්මක කිරීම සඳහා ආඥාවක් කර -

(අ) සැකකරුගේ භාරය එකී පොලිස් ස්ථානයට මාරු කිරීමට;

(ආ) සැකකරු රිමාන්ඩ් භාරයෙන් ඉවත් කිරීමට;

(ඇ) එකී රඳවා තැබීමේ නියමය ප්‍රකාරව එම සැකකරු රඳවා තබා ගැනීමට; සහ

(ඈ) සැකකරු හුදෙකලා කොට තබන ලෙස හෝ ආරක්ෂාව යටතේ තබන ලෙස නියෝග කිරීමට,

පොලිස් ස්ථානය භාර නිලධරයාට අවසර දෙනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තිය යටතේ නිකුත් කරනු ලබන රඳවා තැබීමේ නියමය-

(අ) ලේකම්වරයා විසින් නිකුත් කරනු ලැබිය යුතු ය;

(ආ) වරකට සති දෙකක කාලසීමාවක් බැගින් මාස හයක් නොඉක්මවන සමුච්චිත කාලසීමාවක් සඳහා විය යුතු ය; සහ

(ඇ) සෑම දින දහහතරකට වරක් ම මහාධිකරණය විසින් සමාලෝචනයට ලක් කරනු ලැබිය යුතු ය.

(4) සැකකරු රිමාන්ඩ් භාරයේ සිට රැඳවුම් භාරයට මාරු කිරීම පිළිබඳව, මහාධිකරණය විසින්, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.

(5) රිමාන්ඩ් භාරයේ සිටි තැනැත්තකු විසින් මේ පනත යටතේ රැඳවුම් භාරයේ ගත කළ කාලසීමාව, අපරාධ නඩු විධාන

සංග්‍රහය පනතේ 203 වන වගන්තියේ කාර්ය සඳහා ඔහු රිමාන්ඩ් භාරයේ සිටින කාලසීමාවේ කොටසක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(6) මාස හයක කාලසීමාව අවසන් වූ පසු හෝ ඊට පෙර ඕනෑම විටක දී විමර්ශන අවසන් වී ඇති බවට නීතිපතිවරයා විසින් මහාධිකරණයට දැනුම් දෙනු ලබන්නේ නම්, මහාධිකරණය විසින්, සැකකරු නැවතත් රිමාන්ඩ් භාරයට පත් කිරීම සඳහා ආඥාවක් කරනු ලැබිය යුතු ය.

රිමාන්ඩ් භාරයේ සිටින හෝ රඳවා තබා ඇති සැකකරුට නීතිඥවරයකු වෙත ප්‍රවේශ විය හැකි බව

**26.** මේ පනත යටතේ රිමාන්ඩ් භාරයේ තබා ඇති හෝ රඳවා තබා ඇති සැකකරුවකුට, ලිඛිත නීතියෙන් පනවා ඇති කොන්දේසිවලට යටත්ව, ස්වකීය ඥාතීන්, නීතිඥවරයා හෝ ඔහුගේ කැමැත්ත අනුව වෙනත් යම් තැනැත්තකු සමග සන්නිවේදනය කිරීමේ සහ ඔවුන්ට සැකකරු වෙත පැමිණීමේ අයිතිවාසිකම තිබිය යුතු ය.

නඩු විභාගය අවසන් වන තෙක් රඳවා තැබීම

**27.** (1) (අ) ජාතික ආරක්ෂාවේ හෝ මහජන සාමයේ යහපත පිණිස හෝ නඩු විභාගය පැවැත්වෙන අතරතුර චූදිතයාගේ ජීවිතයට බරපතළ අවධානමක් හෝ හානියක් සිදු වේ යැයි සැකයක් ඇති අවස්ථාවක දී මේ පනත යටතේ අධිචෝදනා පත්‍රයක් ඉදිරිපත් කර ඇත්තේ රිමාන්ඩ් භාරයේ සිටින යම් තැනැත්තකුට එරෙහිව ද, එම තැනැත්තා යම් නීත්‍යානුකූල බලධරයෙකුගේ භාරයේ තැබීම අවශ්‍ය බව හෝ යෝග්‍ය බව ලේකම්වරයාගේ මතය වන්නේ නම්, ඔහු විසින් රඳවා තැබීමේ නියමයේ පිටපතක් ද සමග නඩු විභාගය අවසන් වන තෙක් චූදිතයා රඳවා තැබීම සඳහා රඳවා තැබීමේ නියමයක් නිකුත් කිරීම අවශ්‍ය කරන්නා වූ හේතු දක්වමින් අදාළ මහාධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි අතර, එම ඉල්ලීම සහ ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති විරෝධතා පිළිබඳ විභාග කිරීමෙන් පසු, මහාධිකරණය විසින්, සාධාරණ නඩු විභාගයක් පැවැත්වීම සහතික කිරීම සඳහා වන යම් විධානවලට යටත්ව, රඳවා තැබීමේ නියමය බලාත්මක කරන ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(ආ) 21 වන වගන්තියේ (1) වන, (2) වන, (6) වන සහ (7) වන උපවගන්තිවල විධිවිධාන (ආ) ඡේදය ප්‍රකාරව නිකුත් කරන ලද රඳවා තැබීමේ නියමයක් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය ප්‍රකාර කරනු ලබන රඳවා තැබීමේ නියමය බන්ධනාගාර කොමසාරිස්වරයාට සන්නිවේදනය කරනු ලැබිය යුතු අතර, එම නියමයේ නිශ්චිතව දක්වා ඇති බලධරයාට එම තැනැත්තා භාර කිරීම බන්ධනාගාර කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු අතර (54 වන අධිකාරය වූ) බන්ධනාගාර ආඥාපනතේ විධිවිධාන එම තැනැත්තාගේ භාරය සම්බන්ධයෙන් අදාළ වීම අවසන් විය යුතු ය.

විශේෂ විමර්ශන ක්‍රමවේද සඳහා අධිකරණ අවසරය

**28.** (1) උපපොලිස් පරීක්ෂකවරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන පොලිස් නිලධරයකුට පහත දක්වා ඇති පරිදි පහත දැක්වෙන විශේෂ විමර්ශන ක්‍රමවේද මෙහෙය වීමට බලය පැවතිය යුතු ය:-

(අ) පාලනය නතු කළ භාරදීම්;

(ආ) ඩිජිටල්, කටහඬ, වීඩියෝ, සන්නිවේදන අවහිර කිරීම සහ පටිගත කිරීම ඇතුළු ඩිජිටල් ආවේක්ෂණය;

(ඇ) උපාය දූතයන් සම්බන්ධ වන්නා වූ මෙහෙයුම් ඇතුළු ආවරණ මෙහෙයුම්;

(ඈ) උගුල් ඇටවීම; සහ

(ඉ) පරිගණක, ජංගම දුරකථන, ඩිජිටල් දත්ත ගබඩා කිරීමේ උපාංග සහ වෙනත් ඩිජිටල් උපකරණ මගින් දත්ත, තොරතුරු සහ ප්‍රතිබිම්බවල වෝහාරික උපුටා ගැනීම්:

එසේ වුව ද, උපපොලිස් පරීක්ෂකවරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන පොලිස් නිලධරයකු විසින් ප්‍රමාණවත් කරුණු ද සහිතව, ඒකපාර්ශ්විකව සහ රහසිගතව ඉහත සඳහන් යම් බලයක් ක්‍රියාත්මක කිරීම සඳහා අවසර දෙනු ලබන ආඥාවක් ලබා ගැනීම සඳහා මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(2) ඉහත සඳහන් කරන ලද පරිදි උපපොලිස් පරීක්ෂකවරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන පොලිස් නිලධරයාගෙන් ඉල්ලීමක් ලැබුණු පසුව මහෙස්ත්‍රාත්වරයා විසින් නොපමාව එකී ඉල්ලීම සලකා බැලිය යුතු අතර, සෑහීමට පත්වීමෙන් පසු අවශ්‍ය විශේෂ විමර්ශන ක්‍රමවේද සිදු කිරීම සඳහා අවසර ලබා දිය යුතු ය. මහෙස්ත්‍රාත්වරයා විසින්, අවශ්‍ය අවස්ථාවක, යුක්තියේ කාර්ය සඳහා සපුරාලිය යුතු කොන්දේසි පනවනු ලැබිය හැකි ය.

(3) මහෙස්ත්‍රාත්වරයා විසින් විශේෂ විමර්ශන ක්‍රමවේද සිදු කිරීම සඳහා අවසර ලබා දීමට පෙරාතුව සිදු කළ යුතු එම විමර්ශන ක්‍රමවේද සඳහා සමානුපාතිකත්වයේ මූලධර්මය මත පදනම්ව එය සිදු කිරීම සඳහා අවශ්‍යතාවය සහ සාධාරණීකරණය කිරීම පිළිබඳව සලකා බැලිය යුතු ය.

(4) ඉහත සඳහන් පරිදි අවසර ලබා ගැනීමෙන් පසු උපපොලිස් පරීක්ෂකවරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන පොලිස් නිලධරයා විසින් එසේ අවසරය ලබාගත් විශේෂ විමර්ශන ක්‍රමවේද භාවිත කරමින් සිදු කරන විමර්ශනයේ ප්‍රගතිය දින දහහතරකට වරක් අදාළ මහෙස්ත්‍රාත්වරයා වෙත වාර්තා කළ යුතු ය.

ඒකාබද්ධ විමර්ශන

**29.** (1) ශ්‍රී ලංකාවෙන් පිටත සිදු කරන ලද වරදක් සම්බන්ධයෙන් මේ පනත යටතේ වූ බරපතළ අපරාධයක් ශ්‍රී ලංකාව තුළ සිදු කරනු ලැබ ඇති බවට හෝ සිදු කිරීමට ඇති බවට සැක කරන අවස්ථාවක ඒ රාජ්‍යයේ නිසි බලධරයන් සමග එකඟ වෙනවා විය හැකි යම් කොන්දේසිවලට යටත්ව නීතිපතිවරයාගේ එකඟත්වය මත පොලිස්පතිවරයා විසින් ඒ බලධරයන් සමග ඒකාබද්ධ විමර්ශනයක් පැවැත්වීමට අවසර ලබා දිය හැකි ය.

(2) (1) වන වගන්තිය යටතේ අවසර දෙන ලද ඒකාබද්ධ විමර්ශනයක්-

(අ) විදේශීය රාජ්‍යයක නිසි බලධරයන්ගේ සහයෝගය ඇතිව ශ්‍රී ලංකාව තුළ; හෝ

(ආ) අන්‍යෝන්‍ය ලෙස එකඟවිය හැකි යම් කොන්දේසිවලට අනුකූලව ශ්‍රී ලංකාව තුළ

කොටසක් වශයෙන් සහ විදේශීය රාජ්‍යයට අයත් භූමි ප්‍රදේශය තුළ කොටසක් වශයෙන්,

පවත්වනු ලැබිය හැකි ය.

(3) ඒකාබද්ධ විමර්ශනයක් පවත්වන අවස්ථාවක දී ශ්‍රී ලංකාවේ නීතිය බලාත්මක කිරීමේ බලධරයන් ශ්‍රී ලංකාවේ නීතියට යටත්ව ක්‍රියා කළ යුතු අතර මේ වගන්තියේ කිසිවක් ඒ විදේශීය රාජ්‍යයේ නීතියට අනුකූලව මිස විදේශීය රාජ්‍යයට අයත් භූමි ප්‍රදේශය තුළ විමර්ශනාත්මකව බලතල ක්‍රියාත්මක කිරීමට අවසර දීමක් ලෙස තේරුම් නොගත යුතු ය.

මහෙස්ත්‍රාත් අධිකරණය ඉදිරියේ වන නීති කෘත්‍යය

**30.** අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 9 වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, මේ පනත යටතේ බරපතළ අපරාධයක් සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත්වරයකු වෙත යම් සැකකරුවකු කලින් ඉදිරිපත් කරනු ලැබුවේ ද මේ පනත යටතේ එම සැකකරු සම්බන්ධයෙන් වන විමර්ශනය සහ නීති කෘත්‍යය, එම මහෙස්ත්‍රාත් අධිකරණයේ ම පවත්වනු ලැබිය යුතු ය.

බරපතළ අපරාධයක් සංඥෙය වැරැද්දක් විය යුතු බව සහ මේ පනත යටතේ බරපතළ අපරාධයක් මහාධිකරණය විසින් විසඳිය යුතු බව

**31.** (1) මේ පනත යටතේ වන යම් බරපතළ අපරාධයක් අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථානුකූලව සංඥෙය වරදක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) වෙනත් යම් නීතියක කුමක් සඳහන් වුව ද මේ පනත යටතේ වන බරපතළ අපරාධයක් පිළිබඳ නඩු ඇසීමට, නඩු විභාග කිරීමට සහ දඬුවම් ලබා දීමට මහාධිකරණයට අනන්‍ය අධිකරණ බලයක් පැවතිය යුතු ය.

අපරාධ නඩු විධාන සංග්‍රහය පනත අදාළ කර ගැනීම

**32.** (1) මේ පනත යටතේ වන යම් බරපතළ අපරාධයක දී මේ පනත සහ අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ විධිවිධාන අනුව විමර්ශනයක් කර නඩු පවරා දඬුවම් ලබාදිය යුතු ය.

(2) අපරාධ නඩු විධාන සංග්‍රහයට පනතේ 115 වන සහ 116 වන වගන්තිවල විධිවිධාන මේ පනත යටතේ සැකකරුවකු සම්බන්ධයෙන් කිසිදු ආකාරයකින් අදාළ කර නොගත යුතු ය.

(3) අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ එරෙහිව කුමක් සඳහන් වුව ද මේ පනත යටතේ යම් බරපතළ අපරාධයක් වෙනුවෙන් යම් අධිකරණයක් මගින් හෝ එය ඉදිරියේ නිදහසට කරුණු පවසන හෝ වරදකාරී යයි සොයාගන්නා යම් තැනැත්තකු සම්බන්ධයෙන් ඉහත පනතේ 306 වන වගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

(4) මේ පනතේ විධිවිධානවලට පටහැනි නොවන්නා වූ අපරාධ විධිවිධාන සංග්‍රහය පනතේ විධිවිධාන මේ වගන්තියේ විධිවිධානවලට යටත්ව අවශ්‍ය වෙනස් කිරීම සහිතව මේ පනත යටතේ වන නීති කෘත්‍යයක දී අදාළ කරගත යුතු ය.

2006 අංක 19 දරන විද්‍යුත් ගනුදෙනු පනත අදාළ කර ගැනීම

**33.** 2006 අංක 19 දරන විද්‍යුත් ගනුදෙනු පනතේ විධිවිධාන මේ පනත යටතේ සිදුකරන ලද යම් විද්‍යුත් ගනුදෙනුවක් හා සම්බන්ධ යම් බරපතළ අපරාධයක් සම්බන්ධයෙන් වන යම් විමර්ශන කටයුත්තකට හෝ ඒ හා සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ කරගත යුතු ය.

කාලය මගින් නඩු පැවරීම සීමා කරනු නොලැබිය යුතු ය.

**34.** වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද මේ පනත යටතේ වන බරපතළ වරදක් සඳහා වන නඩු පැවරීමේ අයිතිය යම් කාලය දිගුවක් මගින් සීමා කරනු නොලැබිය යුතු ය.

අර්ථ නිරූපණය

**35.** මේ කොටසේ, "ලේකම්වරයා" යන්නෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන හෝ 45 වන ව්‍යවස්ථාව යටතේ ශ්‍රී ලංකා පොලිස් බලකාය යන විෂයය පවරන ලද අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා අදහස් වේ.

## III වන කොටස

## පොලිස් නිලධරයකුගේ බලතල

මේ පනත යටතේ පොලිස් නිලධරයකුගේ බලතල

**36.** මේ පනත යටතේ වන බරපතළ අපරාධයක් සහ ඒ බරපතළ අපරාධය සිදු කරන අවස්ථාවේ දී එම අපරාධය සිදු කරන එකම සංසිද්ධියේ දී සිදුකළ හැකිව තිබූ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ වන වැරද්දක් පිළිබඳ විමර්ශනයක් පැවැත්වීමේ කාර්යය සඳහා හෝ එවැනි යම් බරපතළ අපරාධයක් සහ වරදක්

සිදුකිරීම වැළැක්වීම සඳහා (53 වන අධිකාරය වූ) පොලිස් ආඥාපනත මගින් හෝ අපරාධ නඩු විධාන සංග්‍රහය පනත මගින් හෝ වෙනත් යම් ලිඛිත නීතියක් මගින් පොලිස් නිලධරයකු වෙත පවරන ලද බලතල කිසිවකට අමතරව බරපතළ අපරාධ සහ මේ පනත යටතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ වන වෙනත් වැරදි පිළිබඳ විමර්ශනය සිදුකිරීම හා ඒවා වැළැක්වීම සඳහා අවශ්‍ය විය හැකිතාක් දුරට මේ කොටසේ නිශ්චිතව සඳහන් කරන ලද බලතල පොලිස් නිලධරයකු වෙත පවරනු ලැබිය යුතු ය.

මේ පනත යටතේ වන බරපතළ අපරාධයක් සිදු කිරීම වැළැක්වීම පොලිස් නිලධරයකුගේ කාර්යය විය යුතු බව

**37.** (1) මේ පනත යටතේ වූ බරපතළ අපරාධයක් සිදුකිරීම වැළැක්වීම පිණිස මේ පනතේ විධිවිධානවලට යටත්ව සුදුසු යයි හැඟී යන යම් පියවරක් ගැනීම සෑම පොලිස් නිලධරයකුගේ ම කාර්යය විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා එවැනි යම් නිලධරයකු විසින්-

(අ) සද්භාවයෙන්;

(ආ) සිදුකරනු ලැබ ඇතැයි කියන ලද වරද සිදුකිරීම නිසා පමුණුවනු ලැබිය හැකි පීඩාවේ ප්‍රමාණයට සමානුපාතිකව; සහ

(ඇ) මේ පනත යටතේ බරපතළ අපරාධයක් සිදුකිරීම වැළැක්වීමට හෝ මේ පනත යටතේ බරපතළ අපරාධයක් සිදු කර ඇත්තාවූ තැනැත්තන් අල්ලා ගැනීමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකිතාක් දුරට පමණක්,

යම් පියවර ගනු ලැබිය හැකි ය.

වාහනයක් හෝ යාත්‍රාවක් යනාදිය නැවැත්වීමට බලය පාවිච්චි කිරීම

**38.** යම් වාහනයක්, යාත්‍රාවක්, දුම්රියක්, ගුවන් යානයක් හෝ මිනිසුන් රහිත ආකාශික වාහනයක් භාරව කටයුතු කරන තැනැත්තකු, මේ පනතේ කාර්යයන් සඳහා ඒ වාහනය, යාත්‍රාව, දුම්රිය, ගුවන් යානය හෝ මිනිසුන් රහිත ආකාශික වාහනය නැවැත්වීම සඳහා පොලිස් නිලධරයකු විසින් කරන ලද යම්

විධානයකට අවනත නොවන අවස්ථාවක ඒ පොලිස් නිලධරයා විසින් ඒ වාහනය, යාත්‍රාව, දුම්රිය, ගුවන් යානය හෝ මිනිසුන් රහිත ආකාශික වාහනය නැවැත්වීමට අවශ්‍ය විය හැකි යම් බලය පාවිච්චි කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, වෙනත් සියලු ක්‍රම මගින් ඒ වාහනය, යාත්‍රාව, දුම්රිය, ගුවන් යානය හෝ මිනිසුන් රහිත ආකාශික වාහනය නැවැත්වීමට අපොහොසත් වී ඇති අවස්ථාවක දී පමණක් එවැනි යම් බලයක් භාවිත කළ හැකි වන්නේ ය.

යම් වාහනයක හෝ යාත්‍රාවක ආදියේ පාලනය යටතට පවරා ගැනීම

**39.** (1) සිදු කරනු ලැබ ඇතැයි කියන ලද බරපතළ අපරාධයකට සම්බන්ධ වන හෝ මේ පනත යටතේ විමර්ශනයක් පැවැත්වීමේ කාර්යය සඳහා හෝ බරපතළ අපරාධයක් සිදු කිරීම වැළැක්වීමේ කාර්යය සඳහා හෝ යම් වාහනයක, යාත්‍රාවක, දුම්රියක, ගුවන්යානයක හෝ මිනිසුන් රහිත ආකාශික වාහනයක පාලනය පොලිස් නිලධරයකු විසින් තමා යටතට පවරා ගනු ලැබිය යුතු ය.

(2) එවැනි යටතට පවරා ගැනීමක් පිළිබඳව නොපමාව මහෙස්ත්‍රාත්වරයකු වෙත වාර්තා කරනු ලැබිය යුතු ය.

යාත්‍රාවක් යාත්‍රා කිරීම හෝ ගුවන් යානයක් ගුවන්ගත වීම ආදිය අත්හිටුවීම හෝ ප්‍රමාද කිරීම

**40.** (1) මේ පනතේ කාර්යය සඳහා, නියෝජ්‍ය පොලිස්පතිවරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන පොලිස් නිලධරයකු විසින්,-

(අ) ඒ ගුවන් යානය ගුවන්ගත කිරීම හෝ යම් යාත්‍රාවක් යාත්‍රා කිරීම පැය හතලිස් අටකට නොවැඩි කාල සීමාවකට අත්හිටුවූ වන ලෙසට හෝ ප්‍රමාද කරන ලෙසට;

(ආ) නම් කරන ලද ගුවන් තොටුපළකට හෝ වෙනත් යම් සුදුසු ස්ථානයකට එවැනි යම් ගුවන් යානයක් ගොඩ බස්සවන ලෙසට; හෝ

(ඇ) යම් යාත්‍රාවක් කිසියම් තොටුපළකට හෝ වරායකට හෝ වෙනත් යම් සුදුසු ස්ථානයකට ගෙන එන ලෙසට,

නියම කරමින් නියෝගයක් කරන ලෙසට ඉල්ලා ඒ ගුවන් යානය හෝ යාත්‍රාව තිබෙන ප්‍රදේශයේ අධිකරණ බලය හිමි මහෙස්ත්‍රාත් අධිකරණයක් වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර ඒ ඉල්ලීම මහෙස්ත්‍රාත්වරයකු විසින් සලකා බැලීමෙන් පසුව එහි නිශ්චිතව සඳහන් කර ඇති යම් කොන්දේසිවලට යටත්ව යම් ආඥාවක් නිකුත් කරනු ලැබිය හැකි ය.

(2) 2002 අංක 34 දරන සිවිල් ගුවන් සේවා අධිකාරිය පනත යටතේ පත්කරන ලද සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත, ගුවන් ආරක්ෂක නිශ්කාෂණය ලබාගැනීමේ කාර්යය සඳහා යම් ගුවන් යානාවක් සම්බන්ධයෙන් (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද එවැනි යම් ආඥාවක් පිළිබඳ දැනුම් දෙනු ලැබිය යුතු ය.

අයිතමයන් රජයේ රස පරීක්ෂකවරයා වෙත හෝ වෙනත් විශේෂඥයකු වෙත කෙලින් ම ඉදිරිපත් කිරීම

**41.** (1) මේ පනත යටතේ වන බරපතළ අපරාධයක් සිදුකිරීම සඳහා අදාළ කර ගන්නා ලදැයි පොලිස් ස්ථානය භාර නිලධරයා විසින් හේතු සහිතව විශ්වාස කරනු ලබන්නා වූ යම් ලේඛනයක්, දෙයක් හෝ ද්‍රව්‍යයක් පරීක්ෂාකර විශ්ලේෂණය කිරීම සඳහා කෙලින් ම රජයේ රස පරීක්ෂකවරයා වෙත හෝ දේශීය හෝ විදේශීය වෙනත් යම් විශේෂඥයකු වෙත භාර දෙනු ලැබිය හැකි ය.

(2) පරීක්ෂණයේ වාර්තාව රජයේ රස පරීක්ෂකවරයා විසින් හෝ වෙනත් විශේෂඥයකු විසින් අදාළ පොලිස් ස්ථානය භාර නිලධරයාට කෙලින් ම භාර දිය යුතු අතර ඒ සමග සැකකරු ඉදිරිපත් කරනු ලැබ ඇති හෝ ඉදිරිපත් කරනු ලබන මහෙස්ත්‍රාත්වරයා වෙත ලබා දිය යුතු පිටපතක් ද ඇතුළත් විය යුතු ය.

විමර්ශන කටයුතු සඳහා කරුණු භාර දීම

**42.** (1) මේ පනත යටතේ බරපතළ අපරාධයක් සම්බන්ධයෙන් විමර්ශනයක් සිදුකරන පොලිස් නිලධරයකු විසින් වෙනත් යම් නීතිය බලාත්මක කිරීමේ නියෝජ්‍යායතනයක විමර්ශන හැකියාව යටතට වැටෙන ඒ අපරාධය හඟවන කරුණු පවතින බවට ඔහුගේ මතය වන්නේ නම් ඒ කරුණු විමර්ශනය කිරීම සඳහා එවැනි වෙනත් යම් නීතිය බලාත්මක කිරීමේ නියෝජ්‍යායතනයකට භාරදීම නීත්‍යානුකූල විය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙන් සඳහන් කරන ලද නීති බලාත්මක කිරීමේ නියෝජ්‍යායතනයක් යන්නට වෙනත් යම් ස්වෛරී රාජ්‍යක නියෝජ්‍යායතනයක් ඇතුළත් විය හැකි ය.

බැංකු, මූල්‍ය ආයතන ආදියෙන් තොරතුරු ලබා ගැනීම

**43.** (1) 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනතේ සහ 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ විධිවිධානවලට යටත්ව තමා වෙත පහත දැක්වෙන තොරතුරු සහ කරුණු සපයන ලෙසට යම් බැංකුවකට, බැංකුවක් නොවන මූල්‍ය ආයතනයකට හෝ නම් කළ මූල්‍ය නොවන ව්‍යාපාරයකට නියම කරන ලෙසට ඉල්ලා මහෙස්ත්‍රාත්වරයකුගෙන් ආඥාවක් ලබා ගැනීම සඳහා අදාළ පොලිස් ස්ථානය භාර නිලධරයා විසින් ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය:-

(අ) ඒ බැංකුව, ආයතනය හෝ ව්‍යාපාරය විසින් යම් තැනැත්තකුට සපයන ලද යම් මූල්‍ය සේවාවකට අදාළ තොරතුරු;

(ආ) යම් තැනැත්තකු විසින් කරගෙන යන ලද යම් මූල්‍ය ගනුදෙනුවක විස්තර;

(ඇ) එවැනි යම් බැංකුවක්, ආයතනයක් හෝ ව්‍යාපාරයක් විසින් සපයන ලද බැංකු ගිණුම්, තැන්පතු, ප්‍රේෂණ සහ මුදල් ආපසු ලබා ගැනීම් සහ මූල්‍ය සේවාවලට අදාළ විස්තර;

(ඈ) යම් තැනැත්තකු විසින් මූල්‍ය සේවා සුරැකීමට අදාළ තොරතුරු; සහ

(ඉ) යම් ගිණුමක් පිළිබඳ සහතික කළ ගිණුම් ප්‍රකාශයක් හෝ යම් ගිණුමකට හෝ ගණුදෙනුවකට අයත් වෙනත් තොරතුරු:

එසේ වුව ද, මේ පනත යටතේ බරපතළ අපරාධයක් සිදුකරන බවට යම් තැනැත්තකුට එරෙහිව සැක කිරීමේ සාධාරණ හේතු පවතී නම් පමණක් මේ වගන්තිය යටතේ ආඥාවක් සඳහා ඒ පොලිස් නිලධරයා විසින් ඉල්ලුම් කරනු ලැබිය හැකි ය.

(2) ඒ පොලිස් නිලධරයා විසින් ඉදිරිපත් කරන ඉල්ලීම මහෙස්ත්‍රාත්වරයා විසින් සලකා බලා විමර්ශනයක් පැවැත්වීම සඳහා සාධාරණ හා අවශ්‍ය බව ඔහුට පෙනී යන අවස්ථාවක (1) වන උපවගන්තියේ නියමයන්ට අනුව ආඥාවක් සිදුකරනු ලැබිය යුතු ය.

(3) මහෙස්ත්‍රාත්වරයා විසින් ඉල්ලීම සම්බන්ධයෙන් රහස්‍යභාවය පවත්වාගෙන යා යුතු අතර එයට අදාළ වන නීතිකෘත්‍ය ඒ පොලිස් නිලධරයා විසින් ඉල්ලා සිටින්නේ නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 106 වන ව්‍යවස්ථාවට යටත්ව රහසිගතව පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

සේවා සපයන්නන්ගෙන් තොරතුරු ලබා ගැනීම

**44.** (1) යම් විදුලිසංදේශ, සැටලයිට් හෝ ඩිජිටල් සේවා හෝ දත්ත සේවා සැපයුම්කරුවන්ට -

(අ) ඒ සේවාසපයන්නා විසින් යම් තැනැත්තකුට සපයන ලද හෝ සපයනු ලබන්නා වූ සේවාවලට අදාළ තොරතුරු;

(ආ) ඒ සේවා ලබාගැනීමට හැකියාව ඇති යම් තැනැත්තකු විසින් භුක්ති විඳින ලද සේවාවලට අදාළ තොරතුරු;

(ඇ) ඒ සේවා සපයන්නා විසින් ගබඩා කළ හැකි, ලේඛනාගාරගත කළ හැකි හෝ අන්‍යාකාරයකින් රඳවා ගත හැකි යම් තොරතුරු, දත්ත, ලේඛන හෝ වාර්තා; හෝ

(ඈ) ඒ සේවා සපයන්නා විසින් සපයන සේවා හරහා යම් උපකරණයක් වෙත හෝ උපකරණයක් මගින් දත්ත හෝ තොරතුරු උත්පතනය හෝ අවපතනය කිරීමට අදාළ තොරතුරු,

ඇතුළුව තොරතුරු සපයන ලෙස නියම කරමින් මහෙස්ත්‍රාත්වරයකුගෙන් ආඥාවක් නිකුත් කරන ලෙස ඉල්ලා අදාළ පොලිස් ස්ථානය භාර නිලධරයා විසින් ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, මේ පනත යටතේ බරපතළ අපරාධයක් සිදුකරන බවට යම් තැනැත්තකුට එරෙහිව සැක කිරීමට සාධාරණ හේතු පවතී නම් පමණක් මේ වගන්තිය යටතේ ආඥාවක් කරන ලෙසට ඒ පොලිස් නිලධරයා විසින් ඉල්ලා සිටිය හැකි ය.

(2) ඒ පොලිස් නිලධරයා විසින් ඉදිරිපත් කළ ඉල්ලීම මහෙස්ත්‍රාත්වරයා විසින් සලකා බලා විමර්ශනයක් පැවැත්වීම සඳහා ආඥාවක් නිකුත් කිරීම සාධාරණය යැයි හා අවශ්‍ය යැයි පෙනී යන අවස්ථාවක (1) වන උපවගන්තියේ නියමයන්ට අනුව ආඥාවක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(3) මහෙස්ත්‍රාත්වරයා විසින් ඉල්ලීම සම්බන්ධව රහස්‍යභාවය පවත්වාගෙන යා යුතු අතර එම පොලිස් නිලධරයා විසින් ඉල්ලා සිටින්නේ නම් ඊට අදාළ නීති කෘත්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 106 වැනි ව්‍යවස්ථාවට යටත්ව රහසිගතව පවත්වනු ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, නියෝජ්‍ය පොලිස්පතිවරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන පොලිස් නිලධරයකු විසින් මහෙස්ත්‍රාත්වරයකුගේ ආඥාවක් නොමැතිව අයිතිකරුගේ හෝ දායකයාගේ හෝ අනන්‍යතාවය, ඇමතුම් හා යම් උපාංගයක හෝ උපකරණයක සංඥා කුළුණු පිහිටීම පිළිබඳව තොරතුරු යම් විදුලිසංදේශ සේවා, සැටලයිට්, ඩිජිටල් සේවාවලින් හෝ දත්ත සේවා සැපයුම්කරුවකුගෙන් ලබා ගත හැකි අතර, ඒ පොලිස් නිලධරයා හෝ ඔහු වෙනුවෙන් කටයුතු කරන නිලධරයකු විසින් එසේ ලබාගත් තොරතුරු ලිඛිතව මහෙස්ත්‍රාත්වරයා වෙත නොපමාව දැනුම් දෙනු ලැබිය යුතු ය.

(5) අයිතිකරුගේ හෝ දායකයාගේ අනන්‍යතාවය ඇමතුම් හෝ යම් උපාංගයක හෝ උපකරණයක සංඥා කුළුණු පිහිටීම සම්බන්ධ තොරතුරු සේවා සැපයුම්කරුවකුගෙන් ලබා ගැනීමට මේ පනත යටතේ බලය පවතින එහෙත් දැනුවත්වම නීත්‍යානුකූල යුක්තිසාධනයකින් තොරව තුන්වන පාර්ශ්වයකින් ඒ තොරතුරු ලබා ගන්නා යම් පොලිස් නිලධරයකු විසින් මේ පනත යටතේ

වරදක් සිදුකරනු ලබන අතර ඒ තැනැත්තා මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබීමේ දී ලක්ෂයකට නොවැඩි දඩයකට සහ අදාළ කරගත හැකි වෙනත් යම් විනයානුකූල ක්‍රියාමාර්ගයකට යටත්විය යුතු ය.

දත්ත හා තොරතුරු සම්බන්ධව ඇති අවහිර කිරීම ඉවත් කිරීම

**45.** (1) (2) වන උපවගන්තියේ සඳහන් කර ලද කාර්යය සඳහා පොලිස් අධිකාරිවරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන පොලිස් නිලධරයකු විසින් මේ පනත යටතේ බරපතළ අපරාධයක් සිදුකරන යම් තැනැත්තකුට එරෙහිව සැක කිරීමට සාධාරණ හේතු පවතින අවස්ථාවක, ඒ නිලධරයා විසින් -

(අ) යම් සන්නිවේදන කටයුතු හෝ දත්ත ගබඩා කිරීමේ සේවා හෝ යම් දත්ත හෝ තොරතුරු හෝ ආම්පන්න හෝ වෙනත් දේවල්වලට අදාළ වන සේවාවන් අවහිර කරන හෝ දත්ත, කේත මගින් සැඟවීමට සලස්වන යම් තැනැත්තකුට ඒ සේවා හෝ උපකරණ අවහිර කිරීම් මුදා හැර ඒ පොලිස් නිලධරයාට ඒ තුළ අඩංගු තොරතුරු ලබා දෙන ලෙසට විධානය කිරීමට;

(ආ) යම් තැපැල් පණිවුඩයක් හෝ විද්‍යුත් තැපෑලක් හෝ යම් දුරකතන, හඬ, අන්තර්ජාලය හෝ දෘශ්‍ය සංවාද, සම්මන්ත්‍රණ හෝ වෙනත් යම් මාධ්‍යක් හරහා ලැබෙන ඕනෑම සන්නිවේදනයක් රඳවා ගන්නා ලෙස, කියවන ලෙස, සවන් දෙන ලෙස හෝ පටිගත කරන ලෙස විධාන කිරීමට; හෝ

(ඇ) යම් ඇනලොග් හෝ ඩිජිටල් දත්තවලට හෝ තොරතුරු හුවමාරු කිරීමේ හෝ පැවරීමේ පද්ධතියකට ප්‍රවේශ වීමට,

ඒ නිලධරයාට බලය ලබා දෙන ලෙසට අයැද සිටිමින් මහෙස්ත්‍රාත්වරයකු වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකි ය.

(2) මේ පනත යටතේ බරපතල අපරාධයක් සිදු කිරීමේ දී (1)වන උපවගන්තිය යටතේ මහෙස්ත්‍රාත්වරයා විසින් ආඥාවක් නිකුත් කරනු ලැබිය හැක්කේ -

(අ) ඒ අපරාධය සිදුකර ඇති තැනැත්තාගේ අනන්‍යතාවය නිශ්චය කිරීමට;

(ආ) අපරාධය සිදුකර ඇති තැනැත්තා සිටින ස්ථානය නිශ්චය කිරීමට;

(ඇ) අපරාධය පිළිබඳ විර්ශනයක් පැවැත්වීමට පහසුකම් සැලැස්වීමට;

(ඈ) අපරාධය සිදුකර ඇති තැනැත්තකුට එරෙහිව සාක්ෂි රැස්කිරීමට;

(ඉ) අපරාධය සිදු කිරීමට තැත් කරනු ලබන්නේ, අනුබල දෙනු ලබන්නේ, කුමන්ත්‍රණය කරනු ලබන්නේ, සංවිධානය කරනු ලබන්නේ, පහසුකම් සලස්වනු ලබන්නේ, උපදෙස් දෙනු ලබන්නේ, කූට්ටනය කරනු ලබන්නේ, විධානය කරනු ලබන්නේ, ආධාර දෙනු ලබන්නේ, දිරි දෙනු ලබන්නේ, පොළඹවනු ලබන්නේ, උනන්දු කරවනු ලබන්නේ, අණ කරනු ලබන්නේ, උපදේශනය කරනු ලබන්නේ හෝ සූදානම් වන්නේ හෝ අපරාධය සිදු කිරීමට යම් ආරම්භක ක්‍රියාවක් සිදු කරන්නේ එක් තැනැත්තකුට වැඩි සංඛ්‍යාවක් ද යන්න නිශ්චය කිරීමට; හෝ

(ඊ) අපරාධය සිදු කිරීම වැළැක්වීමට පියවර ගැනීමට,

යන කාර්යයන් සඳහා විය යුතු ය.

(3) ඒ ඉල්ලීම සද්භාවයෙන් ඉදිරිපත් කර ඇති බවට සහ එවැනි ආඥාවක් සිදු කිරීම විමර්ශනයක් පැවැත්වීම සඳහා සාධාරණ අවශ්‍යතාවයක් වන බවටත් මහෙස්ත්‍රාත්වරයා සෑහීමට පත්වන්නේ නම් ඔහු විසින් ඒ ආඥාව නිකුත් කරනු ලැබිය යුතු ය.

## IV වන කොටස

### ප්‍රකාශවල ආවේශ්‍යතාව

සාක්ෂි ආඥාපනතේ ඇතැම් විධිවිධාන අදාළ නොවිය යුතු බව

**46.** වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද සාක්ෂි ආඥාපනතේ 25 වන, 26 වන සහ 30 වන වගන්තිවල විධිවිධාන මේ පනත යටතේ වූ බරපතළ අපරාධයක් සම්බන්ධයෙන් වන යම් නීති කෘත්‍යයක දී අදාළ නොවිය යුතු ය.

සැකකරුවකු විසින් අත්සන් කළ ප්‍රකාශයක් ආවේශ්‍ය කර ගත හැකි බව

**47.** (1) වෙනත් යම් නීතියක විධවිධානවල කුමක් සඳහන් වුව ද, මේ පනත යටතේ බරපතළ අපරාධයක් සඳහා අධිචෝදනා ලැබූ තැනැත්තකුගේ නීති කෘත්‍යයක දී, ඕනෑම අවස්ථාවක දී ඒ තැනැත්තා විසින් ලියා අත්සන් කර ඉදිරිපත් කළ ප්‍රකාශයක්,-

(අ) ඒ ප්‍රකාශය අපරාධෝච්චාරණයක් වන්නේ හෝ නොවන්නේ වුව ද;

(ආ) ඒ ප්‍රකාශය සිදු කළ අවස්ථාවේ ඒ තැනැත්තා පොලිස් අත්අඩංගුවේ හෝ පොලිස් නිලධරයකු හමුවේ පෙනී සිටින්නේ හෝ නොසිටින්නේ වුව ද;

(ඇ) විමර්ශන ක්‍රියාවලියක දී ඒ ප්‍රකාශයක් කරනු ලැබුවේ හෝ නොලැබුවේ වුව ද; හෝ

(ඈ) ඒ ප්‍රකාශය යම් ප්‍රශ්නයකට පූර්ණ හෝ අර්ධ පිළිතුරක් වූයේ හෝ නොවූයේ වුව ද,

ඒ ප්‍රකාශය සාක්ෂි ආඥාපනතේ 24 වන වගන්තියේ විධිවිධාන යටතේ අදාළ නොවීමක් සිදු නොවන්නේ නම්, ඒ තැනැත්තාට එරෙහිව ඔප්පු කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, ඒ ප්‍රකාශය සිදු කරනු ලැබුවේ සහකාර පොලිස් අධිකාරිවරයකුගේ නිලයට අඩු නිලයක් දරන පොලිස් නිලධරයකු වෙත නම් ඒ තැනැත්තාට එරෙහි සාක්ෂිවල දී ඒ ප්‍රකාශය ආවේශ්‍ය කර ගනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් කළ යම් ප්‍රකාශයක් සාක්ෂි ආඥාපනතේ 24 වන වගන්තියේ විධිවිධාන යටතේ අදාළ නොවන බවට ඔප්පු කිරීමේ භාරය එය අදාළ නොවන බවට තරයේ ප්‍රකාශ කරන තැනැත්තා මත පැවතිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාක්ෂි ලෙස ආවේශ්‍ය කර ගත හැකි යම් ප්‍රකාශයක් මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සඳහන් කරන ලද ප්‍රකාශයක් නොවන සාක්ෂියක් මගින් වැදගත් කරුණු අනුසන්ද්‍රනය කරන්නා වූ යම් ප්‍රකාශයක් වේ නම් සහ එසේ වේ නම් පමණක් ප්‍රකාශය සිදු කරන තැනැත්තා හා එක්ව මේ පනත යටතේ වන බරපතළ අපරාධයක් සඳහා අධිචෝදනා ලැබූ වෙනත් යම් තැනැත්තකුට එරෙහිව ද ආවේශ්‍ය කරගනු ලැබිය හැකි ය.

(4) මේ වගන්තිය යටතේ පවත්වනු ලබන සෑම විධිමත් ප්‍රශ්න කිරීමක් ම ශ්‍රව්‍ය-දෘශ්‍ය පටිගත කළ යුතු අතර ඒ පටිගත කිරීම විමර්ශනයේ නිල වාර්තාවේ කොටසක් විය යුතු ය.

(5) ප්‍රකාශ සටහන් කර ගතයුතු වන්නේ යම් සැකකරුවකුගෙන් ද එවැනි යම් සැකකරුවකුට ඒ විධිමත් ප්‍රශ්න කිරීමට හෝ ප්‍රකාශය සටහන් කර ගැනීමට පෙරාතුව නීතිමය උපදෙස් ලබා ගැනීමට ඔහුගේ කැමැත්ත පරිදි නීතිඥවරයකු හමුවීමට ඔහුට ඇති අයිතිය පිළිබඳව දැනුවත් කරනු ලැබිය යුතු ය.

(6) තාක්ෂණික බිඳවැටීමක් හෝ වෙනත් ව්‍යතිරේක කාරණාවක් හේතුවෙන් (5) වන උපවගන්තියේ නියමයන්ට අනුව විධිමත් ප්‍රශ්න කිරීමක් පටිගත කර ගැනීම කළ නොහැකි අවස්ථාවක දී විධිමත් ප්‍රශ්න කිරීම පවත්වන පොලිස් නිලධරයා විසින් -

(අ) ඒ බිඳවැටීම හෝ නොහැකි වීම සඳහා මුල් වූ හේතු ලිඛිතව සටහන් කර ගැනීම;

(ආ) විධිමත් ප්‍රශ්න කිරීම සටහන් කර ගැනීමකින් තොරව පවත්වාගෙන යාමට ප්‍රායෝගිකව හැකිතාක්

ඉක්මනින් මහෙස්ත්‍රාත්වරයකුගේ අනුමතය ලබා ගැනීම; සහ

(ඇ) ලබාගත් ප්‍රකාශය සැකකරුට දැනගැනීමට කියවා නිම කර ඔහුට තේරුම් ගත හැකි භාෂාවකින් විස්තර කර ඇති බවට සහ ඒ තැනැත්තා විසින් එය අවබෝධ කරගෙන එයට අත්සන හෝ ඔහුගේ පිළිගැනුම තබා ඇති බවට සහතික කිරීම,

කළ යුතු ය.

(7) ශ්‍රව්‍ය-දෘශ්‍ය පටිගත කිරීමක පිටපතක් ප්‍රමාදයකින් තොරව මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර යුක්තියේ යහපත පිණිස අධිකරණය විසින් තීරණය කළ හැකි යම් කොන්දේසිවලට යටත්ව ඒ පිටපත සැකකරුට හෝ ඔහුගේ නීතිඥවරයාට ලබා ගැනීමට සැලැස්විය යුතු ය.

(8) අධිකරණය විසින් පිළිගත් සාධාරණ යුක්ති සාධනයක් නොමැතිව (4) වන උපවගන්තියේ නියමයන් උල්ලංඝනය කර ලබාගත් යම් ප්‍රකාශයක් එහි ඉච්ඡානුගතව සහ ආවේශ්‍යතාව සම්බන්ධයෙන් තියුණු අධිකරණ සන්නිරීක්ෂණයකට යටත්ව සලකා බැලිය යුතු ය.

මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කළ සහ හඳුනා ගැනීමේ පෙරෙට්ටුවක දී කරන ලද ඇතැම් ප්‍රකාශ ආවේශ්‍ය කරගත හැකි බව

**48.** සාක්ෂි ආඥාපනතේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, මේ පනත යටතේ බරපතළ අපරාධයකට අධිචෝදනා ලැබූ තැනැත්තකුගේ නීති කෘත්‍යයක දී පහත දැක්වෙන ප්‍රකාශ ආවේශ්‍ය කර ගත යුතු ය:-

(අ) පොලිස් නිලධරයකු විසින් මහෙස්ත්‍රාත්වරයකු වෙත ඉදිරිපත් කරන ලද මේ පනත යටතේ බරපතළ අපරාධයක් සිදු කිරීමට අදාළ වන යම් සිද්ධියක් පිළිබඳ තියුණු දැනුමක් ඇති තැනැත්තකු විසින් දිවුරුමක් පිට හෝ ප්‍රතිඥා දී මහෙස්ත්‍රාත්වරයකු වෙත කරන ලද්දා වූ ද, ඒ මහෙස්ත්‍රාත්වරයා විසින් අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 277 වන වගන්තියට අනුකූලව වාර්තාගත කරනු ලැබූවා වූ ද ප්‍රකාශයක්; හෝ

(ආ) යම් තැනැත්තකු නඩු විභාගයට පෙනී නොසිටි බව හෝ ඔහුගේ හරස් ප්‍රශ්න කිරීමක් කළ නොහැකි වූයේ හෝ එසේ ප්‍රශ්න කිරීමක් කරනු ලැබ නොමැති බව හෝ නොසලකා මිය ගිය හෝ සොයාගත නොහැකි තැනැත්තකු විසින් කරන ලද මහෙස්ත්‍රාත්වරයකු විසින් සටහන් කරගන්නා ලද හෝ හඳුනාගැනීමේ පෙරෙට්ටුවක දී මහෙස්ත්‍රාත්වරයකු විසින් වාර්තාගත කර ගන්නා ලද ප්‍රකාශයක්.

ඇතැම් ලේඛනවල ආවේශ්‍යතාව

**49.** (1) මේ පනත යටතේ බරපතළ අපරාධයක් සඳහා චෝදනාලත් තැනැත්තකු හෝ ඒ තැනැත්තාගේ අනුයෝජිතයකු හෝ නියෝජිතවරයකු භාරයේ, පාලනයේ හෝ සන්තකයේ තිබී සොයාගත් යම් ලේඛනයක්, ඒ ලේඛනය පිළියෙල කළ තැනැත්තා සාක්ෂිකරුවකු ලෙස කැඳවනු නොලැබුව ද ඒ තැනැත්තාට එරෙහිව සාක්ෂියක් ලෙස අධිකරණය වෙත ඉදිරිපත් කළ හැකි අතර ඒ ලේඛනයේ ඇතුළත් දේ ඒ තුළ ප්‍රකාශිත සිද්ධිය පිළිබඳ බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.

(2) සාක්ෂි ආඥාපනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද සිදු කරන ලද බරපතළ අපරාධයකට හෝ බරපතළ අපරාධයට අදාළ සැකකරුවකුට, සාක්ෂිකරුවකුට හෝ වින්දිතයකුට අදාළව යම් සාක්ෂි දරන ලේඛනමය සාක්ෂියක් සමග විදේශීය නිසි බලධරයකු විසින් නිකුත් කළ ඒ විදේශීය නිසි බලධරයාගේ සහතිකයක් බවට නීතිපතිවරයා විසින් සහතික කළ සහතිකයක් විදේශීය නිසි බලධරයා විසින් තහවුරු කිරීමක් අවශ්‍ය කිරීමකින් තොරව ම ඒ තුළ ප්‍රකාශිත කාරණා පිළිබඳ බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.

සාක්ෂි ආඥාපනතේ 54 වන වගන්තිය අදාළ නොවන බව

**50.** සාක්ෂි ආඥාපනතේ 54 වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, චෝදනාලත් තැනැත්තා සංවිධානාත්මක අපරාධ කාණ්ඩායමක එක් සාමාජිකයකු හෝ ඊට වැඩි සාමාජික පිරිසක් සමග කලින් අවස්ථාවක බරපතළ අපරාධ එකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සිදු කර ඇති බවට වන සාක්ෂි ඇතුළුව 4 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් කළ කාරණා කිසිවකට අදාළ වන සාක්ෂි සංවිධානාත්මක අපරාධ කණ්ඩායමක

සාමාජිකයකු වන්නේ ද යන්න තීරණය කිරීමේ කාර්යය සඳහා මේ පනත යටතේ වන නීති කෘත්‍යයක දී ආවේශ්‍ය කරගනු ලැබිය යුතු ය.

51. මේ පනතේ හෝ වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, 7 වන හෝ 8 වන වගන්ති යටතේ වන වරදක් හැර මේ පනත යටතේ බරපතළ අපරාධයක් සඳහා යම් තැනැත්තකුට විරුද්ධව අධිචෝදනා ගොනු කරන අවස්ථාවක නඩු විභාගය පවත්වන යම් කාලසීමාවක් තුළ දී අධිකරණය විසින්, තීන්දුවට පෙරාතුව චූදිතයා,- 46 වන, 47 වන, 48 වන සහ 49 වන වගන්තිවල විධිවිධාන අදාළ නොවිය යුතු බව

(අ) සංවිධානාත්මක අපරාධ කණ්ඩායමක සාමාජිකයකු නොවන බවට; සහ

(ආ) සංවිධානාත්මක අපරාධ කණ්ඩායමක සාමාජිකයන් විසින් දරනු ලබන සාමාන්‍ය සාපරාධී අරමුණක් ඉෂ්ට කර ගැනීම අභිවෘද්ධිය උදෙසා ක්‍රියා කර නොමැති බවට,

සෑහීමට පත්වීමෙන් පසු, කෙසේ නමුත් (අ) සහ (ආ) වන ඡේදවල සඳහන් කළ චෝදනා අංග දෙකට වරදකරු වීමකින් තොරව, අධිචෝදනාවේ ඇතුළත් කළ කරන ලදැයි කියන බරපතළ අපරාධය චූදිතයා විසින් සිදු කර ඇති බවට අධිකරණයේ මතය වේ නම් විනිශ්චයකාරවරයා විසින් අධිචෝදනාව සංශෝධනය කරනු ලැබිය හැකි අතර, එකී වරද සම්බන්ධයෙන් කිසිදු මූලික නඩු විමසුමක් පවත්වනු ලැබ නොමැති බවට වන කාරණය පිළිබඳ නොසලකා වෙනත් යම් නීතියක් යටතේ එකී වරද සඳහා ඔහු වරදකරු කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, එවැනි අවස්ථානුගත කරුණුවල දී, චූදිතයාගේ වරදකාරීත්වය ඇගැයීමට 46 වන, 47 වන, 48 වන සහ 49 වන වගන්තිවල විධිවිධාන යටතේ ඉදිරිපත් කළ සාක්ෂි නඩුව විභාග කරන විනිශ්චයකාරවරයා විසින් සැලකිල්ලට නොගත යුතු ය:

එසේ ම තවදුරටත්, ඒ වරද, 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ දෙවන උපලේඛනයේ සඳහන් කළ වරදක් වන්නේ නම් සහ චූදිතයා විසින් ජූරි සභාවක් මගින් ඔහුව විනිශ්චය

කිරීම තෝරාගනු ලැබ ඇත්නම් අලුතින් නඩු විභාගය පැවත්විය යුතු අතර 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 11 වන වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධාන අදාළ කරගත යුතු ය.

**බොරු සාක්ෂි ලබා දීම**

**52.** (1) මෙම පනත යටතේ බරපතල අපරාධයක් සඳහා වන නඩු විභාගයක දී යම් සාක්ෂිකරුවෙකු විසින් යම් වැදගත් කරුණක් සම්බන්ධයෙන් ඔහු විසින් කරන ලද සහ මහෙස්ත්‍රාත්වරයකු විසින් සටහන් කරගත් ප්‍රකාශයක් හෝ ඔහු විසින් යම් හඳුනා ගැනීමේ පෙරෙට්ටුවක දී කරන ලද සහ වාර්තා කරගත් ප්‍රකාශයක් ප්‍රකාශිතවම හෝ ව්‍යංගයෙන් හෝ පටහැනිවන ආකාරයෙන් සිදුකරන්නේ නම් මූලාසනාරූඪ විනිශ්චයකාරවරයා විසින් -

(අ) ඒ ප්‍රකාශය මත පදනම්ව කටයුතු කිරීම; සහ

(ආ) ඒ නඩු විභාගය අවසානයේ දී අධිකරණමය කටයුත්තක දී චේතනාන්විතව බොරු සාක්ෂි දීම සම්බන්ධයෙන් අදාළ අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් සකස් කර අත්සන් කරන ලද අධිචෝදනාවක් මත එම සාක්ෂිකරුට චෝදනා එල්ල කර නඩු විභාග කිරීම,

නීත්‍යානුකූල විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ වන නඩු විභාගයක දී සාක්ෂිකරු විසින් පටහැනි ප්‍රකාශයක් සිදුකර ඇති බව ඔප්පු කිරීම ප්‍රමාණවත් විය යුතු අතර ඒ ප්‍රකාශ අතරින් සාවද්‍ය වන්නේ කවර ප්‍රකාශය ද යන්න ඔප්පු කිරීමක් අවශ්‍ය නොවිය යුතු ය.

**මහෙස්ත්‍රාත්වරයකු වෙත කරනු ලැබූ ප්‍රකාශයක ආවේශ්‍යතාවය සඳහා සපුරාලිය යුතු පූර්ව කොන්දේසි**

**53.** වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ පනත යටතේ බරපතළ අපරාධයක් සිදු කරන ලදැයි චෝදනා ලැබූ තැනැත්තකු විසින් මහෙස්ත්‍රාත්වරයකු වෙත කරන ලද ප්‍රකාශයක දී,-

(අ) ඒ ප්‍රකාශය සටහන් කර ගත් මහෙස්ත්‍රාත්වරයා ඒ ප්‍රකාශය සටහන් කර ගැනීමට පෙරාතුව සහ ඉන් පසුව නොපමාව ඒ ප්‍රකාශය ලබා දුන් තැනැත්තා රජයේ අධිකරණ වෛද්‍ය විශේෂඥවරයකුගේ පරීක්ෂාවකට ලක්කිරීමට කටයුතු සලස්වා ඇත්නම් මිස; සහ

(ආ) ඒ ප්‍රකාශය සාක්ෂි වශයෙන් ආවේශ්‍ය කර ගැනීම සත්‍යායනය කිරීමට පවත්වනු ලබන ප්‍රාථමික ශක්නුතා පරීක්ෂණයක දී නඩු පැවරීමේ බලධරයා විසින්, ඒ රජයේ අධිකරණ වෛද්‍ය විශේෂඥවරයාගේ වාර්තාව ඉදිරිපත් කර ඇත්නම් මිස ,

ඒ ප්‍රකාශය ඒ තැනැත්තාට එරෙහිව සාක්ෂි වශයෙන් ආවේශ්‍ය කර නොගත යුතු ය.

## V වන කොටස

### හෙළිදරව් කිරීම සහ රහසින් දැනුම් දීම

**54.** (1) (3) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද මේ පනත යටතේ වන බරපතළ අපරාධයක් සම්බන්ධයෙන් දැනුම් දෙන්නකු විසින් සපයන ලද තොරතුරු යම් නීති කෘත්‍යයක දී සාක්ෂි වශයෙන් ආවේශ්‍ය කර නොගත යුතු අතර යම් නීති කෘත්‍යයක සාක්ෂිකරුවකු විසින්, - දැනුම් දෙන්නකුගේ තොරතුරු සහ අනන්‍යතාවය හෙළිදරව් නොකිරීම

(අ) මේ පනත යටතේ වන බරපතළ අපරාධයක් සම්බන්ධයෙන් තොරතුරු ලබා දී ඇත්තාවූ යම් දැනුම්දෙන්නකුගේ නම සහ ලිපිනය හෙළිදරව් කිරීමට; හෝ

(ආ) දැනුම්දෙන්නාගේ නම හෝ ලිපිනය හෙළිදරව් විය හැකි හෝ හෙළිදරව් වීමට ඉඩ ඇති ප්‍රශ්නවලට පිළිතුරු දීමට ඇත්නම් එවැනි ප්‍රශ්නවලට පිළිතුරු දීමට,

බැඳී සිටිනු නොලැබිය යුතු ය.

(2) සාක්ෂියක දී හෝ යම් නීති කෘත්‍යයක දී සාක්ෂියක් වන්නා වූ හෝ පරීක්ෂාකර බැලීමට යටත් වන්නා වූ යම් පොතක, ලේඛනයක හෝ පත්‍රිකාවක දැනුම්දෙන්නා පිළිබඳ අනාවරණය වීමකට මුල් විය හැකි යම් දැනුම්දෙන්නකු නම් කර ඇති හෝ විස්තර කර ඇති යම් සටහනක් ඇතුළත් වේ නම් දැනුම්දෙන්නා පිළිබඳව අනාවරණය වීම වැළැක්වීමට හැකි සෑම ආකාරයකින්ම එවැනි සටහන් දර්ශනය වීමෙන් වසන් කර තැබීමට හෝ අවලුප්ත කර දැමීමට අධිකරණය විසින් කටයුතු සැලැස්විය යුතු ය.

(3) (අ) යම් හෙයකින් මේ පනත යටතේ දඬුවම් කළ හැකි බරපතළ අපරාධයක් සඳහා අධිකරණය ඉදිරියේ පැවැත්වෙන යම් නීති කෘත්‍යයක දී නීති කෘත්‍යයට අදාළව පූර්ණ විභාග කිරීමකින් අනතුරුව දැනුම් දෙන්නා විසින් අසත්‍ය විය හැකි බවට දැන සිටි හෝ විශ්වාස කළා වූ හෝ සත්‍යයක් විය හැකි බවට විශ්වාස නොකළා වූ වැදගත් ප්‍රකාශයක් දැනුම් දෙන්නා විසින් හිතාමතාම සිදුකර ඇති බවට අධිකරණය සෑහීමට පත් වේ නම්; හෝ

(ආ) වෙනත් යම් නීති කෘත්‍යයක දී, දැනුම්දෙන්නාගේ නම හෙළිදරව් කිරීමෙන් තොරව නීති කෘත්‍යයේ පාර්ශ්වකරුවන් අතර සම්පූර්ණයෙන් යුක්තිය පසිඳලිය නොහැකි වේ නම්,

දැනුම්දෙන්නා පිළිබඳ සෝදිසි කර අදාළ වන සම්පූර්ණ තොරතුරු ලබා දීමට අධිකරණය විසින් අවසර දිය හැකි ය.

දැනුම්දෙන්නකු විසින් තොරතුරු හෙළිදරව් කිරීම

**55.** මේ පනත යටතේ වන බරපතළ අපරාධයක් සම්බන්ධයෙන් පොලිස් නිලධරයකුට තොරතුරු සපයන යම් තැනැත්තකු විසින්,-

(අ) යම් විශ්වසනීය බැඳීමක්; හෝ

(ආ) තොරතුරු සැපයීමක් පිළිබඳව (වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ පනවන ලද සීමා කිරීමක් හැර)

කවරාකාරයෙන් හෝ පනවන ලද වෙනත් යම් සීමා කිරීමක්,

උල්ලංඝනය නොකළ යුතු ය.

රහසින් දැනුම් දීම

**56.** (1) (අ) මේ පනත යටතේ හෝ එහි කාර්යයන් සඳහා පවත්වනු ලබන්නා වූ හෝ පවත්වනු ලැබිය හැකි විමර්ශනයක් හා සම්බන්ධව කටයුතු කරන හෝ කටයුතු කිරීමට අදහස් කරන පොලිස් නිලධරයකු බවට දැන සිටින හෝ දැන සිටින බව සැක කිරීමට සාධාරණ හේතු ඇති; සහ

(ආ) ඒ විමර්ශනයට හෝ පැවැත්වීමට යෝජිත විමර්ශනයට අගතියක් සිදුවිය හැකි වන්නා වූ තොරතුරු හෝ වෙනත් යම් තොරතුරක් වෙනත් යම් තැනැත්තකුට හෙළිදරව් කරන්නා වූ,

තැනැත්තකු වේ නම් ඒ තැනැත්තා වරදක් සිදු කරන අතර මහාධිකරණය විසින් වරදකරු කිරීමේ දී වසර දහයකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමට හෝ රුපියල් ලක්ෂ පහකට නොවැඩි දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දෙකටම හෝ යටත් විය යුතු ය.

(2) නීතිඥවරයකු හෝ ඔහුගේ සේවා නියුක්තයකු විසින් යම් තොරතුරක් හෝ වෙනත් කාරණයක් පිළිබඳ-

(අ) නීතිඥවරයකු ලෙස වෘත්තියේ යෙදෙමින් සේවාදායකයකුට උපදෙස් ලබා දීමට සම්බන්ධ වීමේ දී ඔහුගේ සේවාදායකයකුට හෝ සේවාදායකයාගේ අනුයෝජිතයකුට හෝ;

(ආ) (i) සේවාදායකයාට අදාළ නීති කෘත්‍යයන් මෙහෙයවීමේ දී හෝ ඒ හා සම්බන්ධ වීමේ දී; සහ

(ii) එවැනි නීති කෘත්‍යයවල කාර්යයන් සඳහා,

යම් තැනැත්තකුට,

කරන හෙළිදරව් කිරීමක දී (1) වන උපවගන්තියේ සඳහන් කිසිදු කාරණයකින් ඒ නීතිඥවරයා හෝ ඔහුගේ සේවා නියුක්තයා වරදක් සිදු කරන්නකු බවට පත් නොකල යුතු ය.

(3) යම් නීති විරෝධී කටයුත්තක් ඉෂ්ට කර ගැනීමේ අරමුණින් හෙළිදරව් කරන යම් තොරතුරකට හෝ වෙනත් කාරණාවකට (2) වන උපවගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ වන වරදක් සඳහා යම් තැනැත්තකුට එරෙහිව පවත්වන නීති කෘත්‍යයක දී ඒ හෙළිදරව් කිරීම (1) වන උපවගන්තියේ විස්තර කර ඇති ආකාරයට අගතියක් විය හැකිව තිබු බවට ඒ තැනැත්තා දැන නොසිටි බව හා එසේ සැක කිරීමට සාධාරණ හේතු නොතිබූ බව ඔප්පු කිරීම ඒ තැනැත්තාට විත්තිවාචකයක් විය යුතු ය.

(5) මේ පනතේ හෝ වෙනත් දණ්ඩන නීතියක යම් විධිවිධානයක් බලාත්මක කිරීමක් හෝ අරමුණු කළ බලාත්මක කිරීමක් සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ දී යම් තැනැත්තකු විසින් සිදු කරන ලද කිසිවක් සම්බන්ධයෙන් ඒ තැනැත්තා මේ වගන්තිය යටතේ වන වරදකට වරදකරු නොවන්නේ ය.

## VI වන කොටස

### සාමාන්‍ය විධිවිධාන

**57.** (1) මේ පනත යටතේ වූ බරපතළ අපරාධයකට අධිකරණය විසින් වරදකරු කරන්නා වූ යම් තැනැත්තකුට මීට පෙර මෙහි නිශ්චිතව සඳහන් කර ඇති දණ්ඩනවලින් ඕනෑම දණ්ඩනයක් පනවනු ලැබිය හැකි අතර අධිකරණය විසින් සුදුසු යැයි සිතන්නේ නම් කරනු ලැබුවා වූ බරපතළ අපරාධයට අදාළ ද්‍රව්‍ය සියල්ල හෝ ඉන් කිසිවක් සහ ඒ ද්‍රව්‍ය පැවරීම සඳහා භාවිත කළ කිසිවක් රජය සන්තක කිරීමට යටත්වන බවට ආඥාවක් සිදු කළ හැකි ය. සන්තක කිරීම

(2) (1) උපවගන්තිය යටතේ සන්තක කිරීමක් සඳහා පනවන ලද ආඥාවක දී, -

(අ) ඒ සන්තක කිරීමේ ආඥාවට එරෙහිව කිසිදු අභියාචනයක් අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කර නොමැති අවස්ථාවක ඒ සන්තක කිරීමේ ආඥාවට එරෙහිව අභියාචනාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි කාලසීමාව ඉකුත් වීමේ දී;

(ආ) ඒ සන්තක කිරීමේ ආඥාවට එරෙහිව අභියාචනයක් අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබ ඇති අවස්ථාවක ඒ සන්තක කිරීමේ නියෝගය සහතික කරමින් හෝ ස්ථිර කරමින් ලබා දුන් අභියාචනාධිකරණයේ තීන්දුවට එරෙහිව කිසිදු අභියාචනයක් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කර නොමැති අවස්ථාවක අභියාචනාධිකරණයේ තීන්දුවට එරෙහිව වූ අභියාචනයක් ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කිරීමේ කාලසීමාව ඉකුත්වීමේ දී; හෝ

(ඇ) ඒ සන්තක කිරීමේ ආඥාවට එරෙහිව අභියාචනයක් අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබ ඇති අවස්ථාවක පළමුව සඳහන් කළ අභියාචනය මත සන්තක කිරීමේ නියෝගය සහතික කරමින් හෝ ස්ථිර කරමින් ලබා දුන් අභියාචනාධිකරණයේ තීන්දුවට එරෙහිව අභියාචනයක් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කර ඇති අවස්ථාවක, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ඒ සන්තක කිරීමේ නියෝගය සහතික කරමින් හෝ ස්ථිර කරමින් තීන්දුව ලබා දීමෙන් පසුව,

බලාත්මක විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ රජය සන්තක කළ යම් භාණ්ඩයක් බැහැර කිරීම සම්බන්ධයෙන් අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ IX කොටසේ XXXVIII වන පරිච්ඡේදයේ විධිවිධාන අදාළ කරගත යුතු ය.

**58.** මේ පනතේ හෝ වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද,- දණ්ඩන නියම කිරීමට අදාළ විශේෂ විධිවිධාන

(අ) මේ පනත යටතේ වූ බරපතළ අපරාධයකට යම් තැනැත්තකු වරදකරු කරනු ලබන අවස්ථාවක දී, අධිකරණය විසින්, මේ පනත යටතේ බරපතළ අපරාධයකට ඒ තැනැත්තා මීට පෙර වරදකරු කරනු ලැබ ඇත්නම්, අධිකරණය විසින් අධිකරණයේ සාමාන්‍ය අධිකරණ බල සීමා නොසලකා පනවනු ලැබිය හැකි වන්නා වූ වෙනත් යම් දණ්ඩනයකට අමතරව ඒ තැනැත්තා වෙත ඒ වරද සඳහා නියම කර ඇති උපරිම බන්ධනාගාරගත කිරීමේ කාලසීමාවෙන් තුනෙන් එකකට නොඅඩු කාලසීමාවක් සඳහා බන්ධනාගාරගත කිරීමේ දණ්ඩනයක් පනවනු ලැබිය යුතු ය; හෝ

(ආ) මේ පනත යටතේ වන බරපතළ අපරාධයක් සඳහා යම් තැනැත්තකුට අධිකරණයක් විසින් දණ්ඩනයක් නියම කරනු ලැබ ඇති අවස්ථාවක, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව සහ වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, ඒ තැනැත්තා කලින් නිදහස් කිරීමේ යම් වැඩපිළිවෙළක් යටතේ නිදහස් කිරීම සඳහා සලකා බැලීමට යෝග්‍ය නොවිය යුතු ය.

**59.** මේ පනතේ විධිවිධාන ප්‍රකාර හෝ උද්දේශිත ප්‍රකාර, සද්භාවයෙන් වූ යම් නීත්‍යානුකූල ක්‍රියාවක් හෝ දෙයක් සිදු කරන ලද හෝ සිදු කිරීම නොකර හරින ලද හෝ කරන ලදැයි කියනු ලබන හෝ නොකර හරින ලදැයි කියනු ලබන යම් නිලධරයකුට හෝ තැනැත්තකුට එරෙහිව කිසිඳු සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක් හෝ වෙනත් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක් පවරනු නොලැබිය යුතු ය. නඩු කටයුතුවල දී ආරක්ෂාව

**60.** ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පන පනත, එහි උපලේඛනයේ (ආ) කොටසට පෙරාතුව ම දැක්වෙන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අයිතමය එකතු කිරීමෙන් ඒ පනත මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පන පනතට කරනු ලබන සංශෝධනය

"( ) ....... අංක ............. දරන සංවිධානාත්මක අපරාධ වැළැක්වීමේ පනතේ අර්ථානුකූලව වන වරදක්;".

**61.** මේ පනත ක්‍රියාත්මක වන දිනයේ දී, ශ්‍රී ලංකා ආණ්ඩුව යම් රාජ්‍යයක් සමග ඇති කරගන්නා ලද උද්ධරණ වැඩපිළිවෙළක් බලාත්මකව පවතින අවස්ථාවක දී, ඒ වැඩපිළිවෙළ ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උද්ධරණ පනතේ කාර්යයන් සඳහා මේ පනතේ නිශ්චිතව සඳහන් කරන ලද බරපතළ වැරදි සම්බන්ධනයෙන් උද්ධරණය කිරීම සඳහා වූ විධිවිධාන ඇතුළත් වන බවට සලකනු ලැබිය යුතු ය.

මේ පනතේ බරපතළ අපරාධ සඳහා විධිවිධාන සැලසීම පිණිස සලකා බැලිය යුතු රාජ්‍යයන් සමග බලාත්මකව පවතින උද්ධරණ වැඩ පිළිවෙළවල්

**62.** ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් යම් රාජ්‍යයක් සමග ඇති කරගන්නා ලද උද්ධරණ වැඩ පිළිවෙළක් නොපවත්නා අවස්ථාවක දී, මේ පනතේ නිශ්චිතව සඳහන් කරන ලද බරපතළ අපරාධ සම්බන්ධයෙන් උද්ධරණය කිරීම සඳහා විධිවිධාන සැලසීමේ දී ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උද්ධරණ පනතේ කාර්යයන් සඳහා අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, සම්මුතිය ශ්‍රී ලංකාව හා ඒ රාජ්‍ය සමග ඇති කරගන්නා උද්ධරණ වැඩපිළිවෙළක් ලෙස සලකනු ලැබිය හැකි ය.

සම්මුතිය මේ පනතේ බරපතළ අපරාධ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව සහ ඇතැම් රාජ්‍යයන් අතර ඇති කර ගන්නා උද්ධරණ වැඩපිළිවෙළක් ලෙස අමාත්‍යවරයා විසින් සැලකිය හැකි බව

**63.** මේ පනත යටතේ බරපතළ අපරාධයකට චෝදනා ලත් හෝ වරදකරුවකු කරනු ලැබූ යම් තැනැත්තකු උද්ධරණය කිරීම සඳහා ශ්‍රී ලංකා ආණ්ඩුව සමග ගිවිසුමකට එළඹ ඇති යම් රාජ්‍යයක ආණ්ඩුව විසින් හෝ ආණ්ඩුව වෙනුවෙන් ශ්‍රී ලංකා ආණ්ඩුව වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරන අවස්ථාවක ඒ බරපතළ අපරාධය සඳහා ඒ තැනැත්තාට එරෙහිව නඩු පැවරීම සඳහා හෝ උද්ධරණය කිරීම සඳහා ශ්‍රී ලංකා ආණ්ඩුව ගෙන ඇති හෝ ගැනීමට අරමුණු කරන ක්‍රියාමාර්ග පිළිබඳ ශ්‍රී ලංකා ආණ්ඩුව වෙනුවෙන් අමාත්‍යවරයා විසින් ඉල්ලුම්කාර රාජ්‍යයේ ආණ්ඩුව වෙත නොපමාව දැනුම් දෙනු ලැබිය යුතු ය.

උද්ධරණ ඉල්ලීමක් කරනු ලැබුවේ යම් රාජ්‍යයක තැනැත්තන් සම්බන්ධයෙන් ද එවැනි තැනැත්තන්ට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ග ඉල්ලුම්කාර රාජ්‍යට දැනුම් දීම අමාත්‍යවරයාගේ කාර්යය විය යුතු බව

රාජ්‍යයකට සහාය දැක්වීම

**64.** (1) 2002 අංක 25 දරන සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීම පනතේ 2 වන වගන්තිය යටතේ වන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චිතව සඳහන් කරන ලද පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල් හෝ ඉහත කී පනතේ නියමයන්ට අනුව ශ්‍රී ලංකා රජය ගිවිසුමකට එළඹ ඇති පොදු රාජ්‍ය මණ්ඩලයට අයත් නොවන රටවල් යන දෙයාකාරයෙන් එක් ආකාරයක රටවල් සමඟ මේ පනත යටතේ බරපතළ අපරාධයක් සඳහා විමර්ශනයක් පැවැත්වීම සහ නඩු පැවරීම සඳහා අවශ්‍ය වන සෑම අවස්ථාවක දී ම සහාය සැලසීම සම්බන්ධයෙන් 2002 අංක 25 දරන සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීම පනතේ විධිවිධාන අදාළ කර ගත යුතු ය.

(2) අමාත්‍යවරයා විසින් සුදුසු යයි සිතන ආකාරයේ යම් නියමයන් සහ කොන්දේසිවලට යටත්ව යම් රාජ්‍යයකට සහාය ලබා දිය හැකි ය.

තොරතුරු ලබා දීමට ඇති නීතිමය බැඳීම

**65.** (1) යම් තැනැත්තකු විසින්,-

(අ) වෙනත් යම් තැනැත්තකු, -

(i) මේ පනත යටතේ බරපතළ අපරාධයක් සිදු කිරීමට තැත් දරන බවට, අනුබල දෙන බවට, කුමන්ත්‍රණය කරන බවට, සංවිධානය වන බවට, පහසුකම් සලසන බවට, උපදෙස් දෙන බවට, කූට්ටනය කරන බවට, විධානය කරන බවට, ආධාර දෙන බවට, දිරි දෙන බවට, පොළඹවන බවට, උනන්දු කරවන බවට, අණ දෙන බවට, උපදේශනය කරන බවට හෝ සූදානම් වෙමින් සිටින බවට හෝ බරපතළ අපරාධයක් සිදු කිරීමට යම් ආරම්භක ක්‍රියාවක් සිදු කරන බවට; හෝ

(ii) මේ පනත යටතේ බරපතළ අපරාධයක් සිදුකර ඇති බවට,

දැනුම්වත්වන හෝ එය විශ්වාස කිරීමට හේතු පවතින විටක ඒ තොරතුරු ඒ පළමු තැනැත්තා විසින් දැනුම් දීමට අපොහොසත් වීමේ දී ඒ තැනැත්තා; හෝ

(ආ) මේ පනත යටතේ බරපතළ අපරාධයක් සිදු කර ඇති බවට ඔහු දන්නා යම් තැනැත්තකු සිටින ස්ථානයට අදාළව ඔහු සන්තකයේ යම් තොරතුරු පවතින විටක පොලිස් නිලධරයකුට ඒ තොරතුරු සැපයීමට අපොහොසත් වන හෝ නොමඟ යවන සුලු තොරතුරු සපයන අවස්ථාවක ඒ තැනැත්තා,

මේ පනත යටතේ වරදක් සිදුකරනු ලබන අතර මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබීමේ දී වසර හතක් නොඉක්මවන කාලසීමාවකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් ලක්ෂ දෙකකට නොවැඩි දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දෙකටම හෝ යටත් විය යුතු ය.

(2) මේ ලිඛිත නීතියකින්, ගිවිසුමකින්, දිවුරුමකින්, හෝ අන්‍යාකාරයකින් පනවන ලද රහස්‍යභාවය පිළිබඳ යම් බැඳීමක් හෝ වෙනත් සීමා කිරීමක් නොසලකා යම් තැනැත්තකු (1) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතු ය.

අර්ථ නිරූපණය

**66.** පද සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් අවශ්‍ය වුවහොත් මිස මේ පනතේ-

“සන්නද්ධ හමුදා” යන්නට,

(අ) (357 වන අධිකාරය වූ) යුද්ධ හමුදා පනතේ විධිවිධානවලට අනුකූලව පිහිටුවා පවත්වාගෙන යන ශ්‍රී ලංකා යුද්ධ හමුදා සමාජිකයන්;

(ආ) (358 වන අධිකාරය වූ) නාවික හමුදා පනතේ විධිවිධානවලට අනුකූලව පිහිටුවා පවත්වාගෙන යන ශ්‍රී ලංකා නාවික හමුදාවේ සමාජිකයන්; සහ

(ඇ) (359 වන අධිකාරය වූ) ගුවන් හමුදා පනතේ විධිවිධානවලට අනුකූලව පිහිටුවා පවත්වාගෙන යන ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සාමාජිකයන්,

ඇතුළත් වේ;

"අපරාධ නඩු විධාන සංග්‍රහය පනත" යන්නෙන්, 1979 අංක 15 දරන අපරාධ නඩු විධිවිධාන සංග්‍රහය පනත අදහස් වේ;

"පාලනයට නතු කළ භාරදීම්" යන්නෙන්, පහත දැක්වෙන කරුණු ඇතුළුවන නමුත් ඊට සීමා නොවන මේ පනතේ පරමාර්ථ ඉටු කරගැනීමේ කාර්ය සඳහා පොලිස් නිලධරයකුට කෙලින්ම හෝ වක්‍රාකාරව ආවේශනයට අවසර දෙන විමර්ශන ශිල්පීය ක්‍රමයන් අදහස් වේ:-

(අ) මේ පනත යටතේ සිදු කරනු ලැබ ඇති බවට සැක කරන බරපතළ අපරාධයක් සහ සිදු කරනු ලබන බරපතළ අපරාධයක් පිළිබඳව වැඩිදුර විමර්ශනය කිරීම හැකි කරවන;

(ආ) ඉහත ප්‍රකාශිත බරපතළ අපරාධ සිදු කිරීමේ දී ඊට සම්බන්ධ වූ සියලු තැනැත්තන් හඳුනා ගැනීම;

(ඇ) ඒ බරපතළ අපරාධවලට අදාළ වන සාක්ෂි රැස් කිරීම; හෝ

(ඈ) ඒ බරපතළ අපරාධවලට සම්බන්ධ වූ තැනැත්තන් අනාවරණය කර ගැනීම සහ හඳුනා ගැනීම;

"සාක්ෂි ආඥාපනත" යන්නෙන්, ( 14 වන අධිකාරය වූ) සාක්ෂි ආඥාපනත අදහස් වේ;

"මහාධිකරණය" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් ස්ථාපිත කරන ලද අදාළ පළාතේ මහාධිකරණය අදහස් වේ;

"තොරතුරු පොත" යන්නට, ප්‍රකාශන සටහන් කර ගැනීමේ කාර්යය සඳහා අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව සහ යම් විමර්ශන කාර්යාංශයක් මගින් පවත්වාගෙන යන අපරාධ පිළිබඳ සටහන් පොතක් හෝ ලිපි ගොනුවක් අදහස් වේ;

"මූල්‍ය හෝ වෙනත් ද්‍රව්‍යමය ප්‍රතිලාභ"යන්නට, සේවා ඇතුළුව මූල්‍ය ප්‍රතිලාභ හෝ මූල්‍ය නොවන ආකාරයෙන් වන පෙළඹවීම්, ගෙවීම්, අල්ලස්, තෑගි හෝ වෙනත් වාසි අදහස් වේ;

"අමාත්‍යවරයා" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන හෝ 45 වන ව්‍යවස්ථාව යටතේ මේ පනත පවරන ලද අමාත්‍යවරයා අදහස් වේ;

"සංවිධානාත්මක අපරාධ කණ්ඩායම" යන්නෙන්, බරපතළ අපරාධයක් සිදු කිරීම සඳහා එකඟතාවයෙන් යුතුව ක්‍රියා කරන සාමාජිකයන් තුන්දෙනෙකුගෙන් හෝ ඊට වැඩි ගණනකින් යුක්ත හා කාලසීමාවක් තුළ පවත්නා සහ කෙළින් ම හෝ වක්‍රාකාරයෙන් මූල්‍යමය හෝ වෙනත් ද්‍රව්‍යමය ප්‍රතිලාභයක් ලබා ගැනීමට බරපතළ අපරාධ එකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් සිදු කිරීමේ අරමුණින් කටයුතු කරන ව්‍යුහගත කණ්ඩායමක් අදහස් වේ;

"ව්‍යුහගත කණ්ඩායම" යන්නෙන්, ක්ෂණික බරපතළ අපරාධයක් කිරීම සඳහා සසම්භාවී ආකාරයෙන් සැකසුනු කණ්ඩායමක් නොවන සහ එහි සාමාජිකයන්ට විධිමත් ලෙස නිශ්චිත වශයෙන් කර්තව්‍යය දැක්වීමක් අවශ්‍ය නොවන, සාමාජිකත්වයේ අඛණ්ඩතාවයක් අවශ්‍ය නොවන හෝ වර්ධිත ව්‍යුහයක් අවශ්‍ය නොවන කණ්ඩායමක් අදහස් වේ;

"පොලිස් නිලධරයා" යන්නට, (53 වන අධිකාරය වූ) පොලිස් ආඥාපනතේ එයට දී ඇති අර්ථයම තිබිය යුතු ය; සහ

"ආවරණ මෙහෙයුම්" යන්නෙන්,මේ පනතේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමේ කාර්ය සඳහා පහත දැක්වෙන කරුණු ඇතුළත් වන නමුත් ඊට සීමා නොවන -

(අ) සැකකරුවන් සොයා ගැනීම, නිශ්චය කර ගැනීම, හඳුනා ගැනීම සහ සෝදිසි කිරීම;

(ආ) බරපතළ අපරාධ සිදු කරන තැනැත්තන් හඳුනා ගැනීම; සහ

(ඇ) ඒ තැනැත්තන්ට සහ බරපතළ අපරාධ සිදු කිරීමට අදාළ විමර්ශන කටයුතු සිදු කිරීම සහ සාක්ෂි රැස් කිරීම ඇතුළුව,

බරපතළ අපරාධයක් සංස්ථාපනය වන ක්‍රියාවන් විය හැකි හැසිරීම්වල නිරත වීම ඇතුළත් පොලිස් නිලධරයකු සම්බන්ධ වන්නා වූ විමර්ශනයක් තුළ වන ක්‍රියාවලියක් අදහස් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**67.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## පළමු වන උපලේඛනය

**[3 වන වගන්තිය]**

| | I වන තීරය | II වන තීරය | III වන තීරය |
|---|---|---|---|
| *අංකය* | *ප්‍රඥප්තිය* | *වගන්තිය* | *වරදේ ස්වභාවය* |
| 1. | (188 වන අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනත | 15 | පුරාවස්තු සොයා ගැනීමට අදාළ වැරදි |
| 2. | 2023 අංක 10 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත | 14 | අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු බිය ගැන්වීම |

| | I වන තීරය | II වන තීරය | III වන තීරය |
|---|---|---|---|
| *අංකය* | *ප්‍රඥප්තිය* | *වගන්තිය* | *වරදේ ස්වභාවය* |
| 3. | 2007 අංක 58 දරන රසායනික අවි සම්මුතිය පිළිබඳ පනත | 20 | විෂ සහිත රසායනික ද්‍රව්‍ය හෝ ඒවායේ පූර්වගයන් සෑදීම, නිෂ්පාදනය අත්කර ගැනීම ආදිය තහනම් බව |
| 4. | 2007 අංක 58 දරන රසායනික අවි සම්මුතිය පිළිබඳ පනත | 21 | (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනතට අනුකූලව අපනයන කිරීම හෝ ආනයනය කිරීම කළ යුතු බව |
| 5. | 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනත | 82 | අන්තරායකාරී පියසර මෙහෙයුම් |
| 6. | 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනත | 103 | පනතේ විධිවිධාන, නියෝග ආදිය උල්ලංඝනය කිරීම |
| 7. | 2007 අංක 24 දරන පරිගණක අපරාධ පනත | 7 | නීත්‍යනුකූල නොවන ආකාරයෙන් ලබාගත් දත්ත ආදිය සමග කටයුතු කිරීම වරදක් බව |
| 8. | 2007 අංක 24 දරන පරිගණක අපරාධ පනත | 8 | නීති විරෝධී ලෙස දත්ත අත්කර ගැනීම වරදක් බව |
| 9. | 2007 අංක 24 දරන පරිගණක අපරාධ පනත | 9 | වරදක් කිරීම සඳහා නීති විරෝධී උපක්‍රම සැපයීම වරදක් බව |
| 10. | 2007 අංක 24 දරන පරිගණක අපරාධ පනත | 10 | සේවාවකට ප්‍රවේශ වීමට නීත්‍යනුකූල බලයක් නොමැතිව තොරතුරු අනාවරණය කිරීම වරදක් බව |
| 11. | 2007 අංක 24 දරන පරිගණක අපරාධ පනත | 11 | වැරදි සිදු කිරීමට තැත් කිරීම |
| 12. | 2007 අංක 24 දරන පරිගණක අපරාධ පනත | 12 | වරදක් සිදු කිරීමට අනුබල දීම |
| 13. | 2007 අංක 24 දරන පරිගණක අපරාධ පනත | 13 | වරදක් සිදු කිරීමට කුමන්ත්‍රණය කිරීම |
| 14. | (235 අධිකාරය වූ) රේගු ආඥාපනත | 146 | ආඥාපනතේ යම් වගන්තියක් යටතේ රාජ්‍ය සන්තක කිරීමට හෝ දණ්ඩනයට යටත් වන තැනැත්තන් වරදකට වරදකරුවන් වන බව |
| 15. | (52 වන අධිකාරය වූ) සුරාබදු ආඥාපනත | 46 | නීති විරෝධී ආනයන සඳහා දණ්ඩන |

| | I වන තීරය | II වන තීරය | III වන තීරය |
|---|---|---|---|
| *අංකය* | *ප්‍රඥප්තිය* | *වගන්තිය* | *වරදේ ස්වභාවය* |
| 16. | (52 වන අධිකාරය වූ) සුරාබදු ආඥාපනත | 47 | නීති විරෝධී සන්තකයේ තබා ගැනීම සඳහා හෝ ප්‍රවාහනය සඳහා |
| 17. | (52 වන අධිකාරය වූ) සුරාබදු ආඥාපනත | 48 | බලපත්‍රලාභියකු විසින් සිදු කරන විෂමාචාර සඳහා |
| 18. | (469 වන අධිකාරය වූ) වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත | 37 | අවසරපත්‍ර නොමැතිව ක්ෂීරපායී සතුන්, පක්ෂීන්, උරගයන්, උභය ජීවීන්, මත්ස්‍යයන් සහ කොඳු ඇට පෙළ රහිත සතුන් අවසර නොමැතිව ආනයනය තහනම් කිරීම |
| 19. | (469 වන අධිකාරය වූ) වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත | 39 | ක්ෂීරපායී සතුන්, පක්ෂීන්, උරගයන්, උභය ජීවීන්, මත්ස්‍යයන් හෝ කොඳු ඇට පෙළ රහිත සතුන් නීති විරෝධී ලෙස ආනයනය කිරීම හෝ මුදා හැරීම සම්බන්ධයෙන් දණ්ඩන |
| 20. | 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත | 27 | යම් තැනැත්තකු සන්තකයේ, නැතහොත් ඔහුගේ හෝ ඇයගේ මාර්ගෝපකරණවල නියමිත ගණනට වඩා මුදල් හෝ ගනුදෙනු කළ හැකි ධාරක සාධන පත්‍ර සහිතව, ශ්‍රී ලංකාවෙන් ඉවත්ව යන හෝ ශ්‍රී ලංකාවට පැමිණෙන යම් තැනැත්තකු ප්‍රථමයෙන් එම කරුණ අදාළ බලධරයාට වාර්තා නොකිරීම. |
| 21. | 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත | 28 | වැරදි තොරතුරු දීම වරදක් බව |
| 22. | (451 වන අධිකාරය වූ) වන කැළෑ ආඥාපනත | 20 | සංරක්ෂණ වනයක, රක්ෂිත වනයක හෝ ගම්බද වනයක හැර වෙනත් වනයක දී තහනම් කරන ලද ක්‍රියා |
| 23. | (451 වන අධිකාරය වූ) වන කැළෑ ආඥාපනත | 25 | දණ්ඩන (මේ පනතේ යම් විධිවිධානයක් කඩකිරීම සඳහා) |

| | I වන තීරය | II වන තීරය | III වන තීරය |
|---|---|---|---|
| *අංකය* | *ප්‍රඥප්තිය* | *වගන්තිය* | *වරදේ ස්වභාවය* |
| 24. | 2025 අංක 17 දරන සූදු ක්‍රීඩා නියාමන අධිකාරිය පනත | 42 | බලපත්‍රයක් නොමැතිව සූදු ක්‍රීඩා කිරීම |
| 25. | 2025 අංක 17 දරන සූදු ක්‍රීඩා නියාමන අධිකාරිය පනත | 43 | අසත්‍ය, නොමඟ යවන සුලු හෝ වැරදි තොරතුරු සැපයීම |
| 26. | 2025 අංක 17 දරන සූදු ක්‍රීඩා නියාමන අධිකාරිය පනත | 44 | නීති විරෝධී සූදු ක්‍රීඩා ප්‍රචාරණය කිරීම |
| 27. | 2025 අංක 17 දරන සූදු ක්‍රීඩා නියාමන අධිකාරිය පනත | 45 | අනුමත සූදු ක්‍රීඩා පරිශ්‍රයෙන් පිටත සූදු ක්‍රීඩා ක්‍රියාත්මක කිරීම ආදිය |
| 28. | 2025 අංක 17 දරන සූදු ක්‍රීඩා නියාමන අධිකාරිය පනත | 46 | පරිශ්‍රයක හිමිකරුවකු හෝ පදිංචිකරුවෙකු විසින් නීති විරෝධී සූදු ක්‍රීඩා සඳහා එම පරිශ්‍රය භාවිත කිරීම හෝ භාවිත කිරීමට ඉඩ දීම |
| 29. | 2025 අංක 17 දරන සූදු ක්‍රීඩා නියාමන අධිකාරිය පනත | 47 | නීති විරෝධී සූදු ක්‍රීඩා සංවිධානය කිරීමේ වරද |
| 30. | 2025 අංක 17 දරන සූදු ක්‍රීඩා නියාමන අධිකාරිය පනත | 48 | නීති විරෝධී සූදු ක්‍රීඩා සඳහා මුදල් සැපයීමේ වරද |
| 31. | 2025 අංක 17 දරන සූදු ක්‍රීඩා නියාමන අධිකාරිය පනත | 50 | තහනම් හෝ අනුමත නොකළ සූදු ක්‍රීඩා යන්ත්‍ර භාවිතය |
| 32. | 2025 අංක 17 දරන සූදු ක්‍රීඩා නියාමන අධිකාරිය පනත | 51 | නිසි වයසට අඩු තැනැත්තන් සමග සූදු ක්‍රීඩා කිරීම |
| 33. | 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත | 178 | ප්‍රකාශන අයිතිය උල්ලංඝනය කිරීම |
| 34. | 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත | 179 | කාර්මික සැලසුම් උල්ලංඝනය කිරීම |
| 35. | 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත | 180 | කාර්මික සැලසුම පිළිබඳ අසත්‍ය කරුණු දැක්වීම |
| 36. | 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත | 181 | පේටන්ට් බලපත්‍ර උල්ලංඝනය කිරීම |
| 37. | 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත | 182 | පේටන්ට් බලපත්‍ර සම්බන්ධයෙන් සාවද්‍ය නියෝජනය |
| 38. | 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත | 183 | පේටන්ට් බලපත්‍ර පිළිබඳ තොරතුරු නීති විරෝධී ලෙස අනාවරණය කිරීම |
| 39. | 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත | 184 | ලකුණු උල්ලංඝනය කිරීම |

| | I වන තීරය | II වන තීරය | III වන තීරය |
|---|---|---|---|
| *අංකය* | *ප්‍රඥප්තිය* | *වගන්තිය* | *වරදේ ස්වභාවය* |
| 40. | 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත | 185 | වෙළඳ ලකුණ පිළිබඳව අසත්‍ය කරුණු දැක්වීම |
| 41. | 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත | 186 | ලකුණු හා වෙළඳ විස්තර පිළිබඳ වෙනත් වැරදි |
| 42. | 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත | 63(1) | බලපත්‍රයක් ආදිය රහිතව ගවේෂණය කිරීම, පතල් කැණීම, සැකසීම ආදිය |
| 43. | 2006 අංක 30 දරන ගෙවීම් උපක්‍රම වංචා පිළිබඳ පනත | 3(1) (ඊ) (එ) (ක) (ග) (ච) සහ (ජ) | ගෙවීම් උපක්‍රම වංචා සංයුක්ත වන ක්‍රියා |
| 44. | (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහය | 101 සිට 113(ආ) දක්වා | මේ උපලේඛනයේ දක්වා ඇති අදාළ වරද සඳහා අවුරුදු හතරකට අඩු යම් වරදක් සිදු කිරීමට අනුබල දීම, කුමන්ත්‍රණය කිරීම ආදිය |
| 45. | (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහය | 128 | හමුදාවෙන් නොමහට හැරගිය බන්ධනාගාරගත කිරීමක් ඇති තැනැත්තන් සම්බන්ධයෙන් වන අපරාධ |
| 46. | (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහය | 132 | සෙබළකුට, නාවික භටයකුට හෝ ගුවන් භටයකුට පලා යාම සඳහා අනුබල දීම |
| 47. | (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහය | 133 | පලා යන්නකු රැක වසන් කිරීම |
| 48. | (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහය | 137 | සෙබළකුගේ, නාවික භටයකුගේ හෝ ගුවන් භටයකුගේ ඇඳුම් ඇඳීම |
| 49. | (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහය | 183 | රාජකාරී කටයුතු ඉටු කිරීමේ දී රජයේ සේවකයකුට බාධා කිරීම |
| 50. | (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහය | 337 | රහසේ අයුතු ලෙස සිර කර තැබීම |
| 51. | (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහය | 338 | දේපළ ත්‍රාසද්ග්‍රහණය කිරීමේ හෝ නීති විරෝධී ක්‍රියාවක් බලෙන් කරවීමේ හෝ කාර්යය සඳහා අයුතු ලෙස සිරකර තැබීම |

| | I වන තීරය | II වන තීරය | III වන තීරය |
|---|---|---|---|
| *අංකය* | *ප්‍රඥප්තිය* | *වගන්තිය* | *වරදේ ස්වභාවය* |
| 52. | (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහය | 344 | තම කාර්යය ඉටු කිරීමෙන් වැළැක්වීම සඳහා රජයේ සේවකයෙකුට සාපරාධ බලහත්කාරය පෑම |
| 53. | (218 වන අධිකාරය වූ) විෂ වර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග ආඥාපනත | 54(අ) සහ 54(ආ) | අන්තරායදායක ඖෂධ නිෂ්පාදනය, ජාවාරම් කිරීම, ආනයනය කිරීම හෝ අපනයනය කිරීම සහ සන්තකයේ තබා ගැනීම සහ එවැනි වැරදිවලට අනුබල දීම සහ අබිං සම්බන්ධයෙන් (එම ප්‍රඥප්තියේ උපලේඛනයේ III වන කොටස ප්‍රකාරව) කිලෝග්‍රෑම් 1 කට අඩු වන ප්‍රමාණයක් වන විට දී |

## දෙවන උපලේඛනය

**[19(1) වන වගන්තිය]**

### අත්අඩංගුවට ගැනීම සහ රඳවා තැබීම පිළිබඳ දැනුම් දීම

1. අත්අඩංගුවට පත් වූ තැනැත්තාගේ නම :-
2. අත්අඩංගුවට පත් වූ දිනය, වේලාව සහ ස්ථානය :-
3. අත්අඩංගුවට ගැනීමට හේතු :-
4. අත්අඩංගුවට පත් තැනැත්තා රඳවා තැබීමට යෝජිත ස්ථානය :-
5. අත්අඩංගුවට ගන්නා ලද නිලධරයාගේ නම, හඳුනාගැනීමේ අංකය සහ තනතුර :-
6. අත්අඩංගුවට පත් තැනැත්තාට ආසන්න සම්බන්ධතාවක් ඇති ඔහුගේ ළඟම ඥාතියාට ඔහු වෙත සාධාරණ ප්‍රවේශයක් ලබා ගැනීමට අවශ්‍ය විය හැකි වෙනත් යම් තොරතුරු :-
7. දැනුම් දීම නිකුත් කරනු ලබන්නේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තාගේ අනන්‍යතාවය :-
8. දැනුම් දීම නිකුත් කරන දිනය සහ ස්ථානය :-
9. දැනුම් දීම නිකුත් කරන නිලධරයාගේ නම, තනතුර සහ අත්සන :-

## තුන්වන උපලේඛනය

[19(3) වන වගන්තිය]

### අත්අඩංගුවට ගැනීම පිළිබඳ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත කරනු ලබන දැනුම් දීම

1. අත්අඩංගුවට පත් වූ තැනැත්තාගේ නම :-
2. අත්අඩංගුවට පත් වූ දිනය, වේලාව සහ ස්ථානය :-
3. අත්අඩංගුවට ගැනීමට හේතු :-
4. සැකකරු රඳවා තබන්නා වූ ස්ථානයේ පිහිටීම :-
5. අත්අඩංගුවට ගන්නා ලද නිලධරයාගේ නම, හඳුනාගැනීමේ අංකය සහ නිලය :-
6. රඳවා තබන ස්ථානය භාර නිලධරයාගේ නම සහ තනතුර සහ ඔහුගේ ඇමතුම් තොරතුරු :-
7. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට,
   (අ) සැකකරු වෙත ක්ෂණිකව ළඟාවීමට; සහ
   (ආ) ඒ අත්අඩංගුවට ගැනීම සහ රඳවා තැබීම තුළින් සැකකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වන්නේ ද යන්න විමසා බැලීමට,

   හැකි කරන්නා වූ වෙනත් යම් තොරතුරු: -

## හතරවන උපලේඛනය

[19(3) වන වගන්තිය]

### අත්අඩංගුවට ගැනීම පිළිබඳව පොලිස්පතිවරයා වෙත යවන නිවේදනය

1. අත්අඩංගුවට පත් වූ තැනැත්තාගේ නම :-
2. අත්අඩංගුවට පත් වූ දිනය, වේලාව සහ ස්ථානය :-
3. අත්අඩංගුවට ගැනීමට හේතු :-
4. සැකකරු රඳවා තබා ඇති ස්ථානයේ පිහිටීම :-
5. අත්අඩංගුවට ගන්නා ලද නිලධරයාගේ නම, හඳුනාගැනීමේ අංකය සහ නිලය :-
6. රැඳවුම් ස්ථානය භාර නිලධරයාගේ නම සහ තනතුර සහ ඔහුගේ ඇමතුම් තොරතුරු:-

## පස්වන උපලේඛනය

[21(2) වන වගන්තිය]

### රඳවා තැබීමේ නියමය

1. රඳවා තැබීමේ නියමයේ අංකය :-
2. රඳවා තැබීමේ නියමය නිකුත් කරන ලද දිනය සහ ස්ථානය :-

3. රඳවා තැබීමේ නියමය නිකුත් කරන ලෙස ඉල්ලා සිටි නිලධරයාගේ අනන්‍යතාවය සහ ඉල්ලීමේ දිනය සහ අදාළ වන්නේ නම් යොමු අංකය :-
4. රඳවා තැබීමට බලය දෙනු ලැබුවේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තාගේ (සැකකරුගේ) නම :-
5. සැකකරු රඳවා තබන පොලිස් ස්ථානය :-
6. රැඳවුම් කාලසීමාව :-
7. සැකකරු රඳවා තැබීමට අවසර දීමට මූලික වූ හේතු :-